www.AlevelApi.com



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Adv. Level) Examination, 2021(2022)

සිංහල I
சிங்களம் I
Sinhala I

71 S I

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.**

**උපදෙස්:**
※ **පළමු** ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

**1.** පහත දැක්වෙන **(අ)**, **(ආ)**, **(ඉ)**, **(ඊ)** හා **(උ)** උද්ධෘත අතුරෙන් **සතරක්** තෝරා ගෙන ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට ද **(ඌ)** හා **(එ)** ප්‍රශ්නවලට ද පිළිතුරු සපයන්න. (මේ ප්‍රශ්නයට පිළිතුරු ලිවීමේ දී වර්තමාන ලේඛන ව්‍යවහාරය ම යොදා ගන්න.)

**(අ)** සැවත් නුවර අදින්නපුබ්බක නම් බමුණාණකෙනෙක් වෙසෙති. උෟ තුමූ සුධාභොජන ජාතකයෙහි කෙළගණන් වස්තු ඇති සිටාණන් සක්දෙව්දුගේ උපදෙසින් දන්දීමෙහි අදහස් ඇති වන තෙක් කිසි කෙනකුන්ට කිසිවක් දීලන්ට මැළියා සේ ඉල්ලීස සිටාණන් ඉල්ලීස සිටුවෙස් ගත් සක්දෙව්දුහු සම්පත් විසුරුවා දන් දෙන තෙක් තමන් දීගත නුහුණු වූවා සේ බුදුන්ගෙන් බණ අසා නිවන් දැක මසුරුසිත් තුනී වන තෙක් තණ අග ගලා තෙල් බින්දුවක් විතරත් අනුන්ට නුදුන්විරු ය. එසේ හෙයින් 'අදින්නපුබ්බක'ය යන නම අර්ථාන්විත නම ය. උන්ගේ එක ම පුතණුකෙනෙක් ඇත. ජීවිතයක් සේ ඉතා ප්‍රියයෝ ය. ඒ ප්‍රිය පුතණුවන්ට ආභරණයක් කරවන්ට සිතා කෙළගණන් සම්පත් ඇති තැනැත්තෝ නුග ගස මහත් වත් නුග ඵලය කුඩා වන්නා සේ සම්පත් මහත් වූවත් අදහස කුඩා බැවින් ආභරණ කරවන්ට බඩාල් කෙනකුන් ගෙනාවොත් කර්මාන්ත කරවන තෙක් දවස් උන්ට බතුත් දියයුතු ය. එසේ කලට **නැතක් වී සාල්** වියදම් වෙයි.

(i) 'අදින්නපුබ්බක' යන නම අර්ථාන්විත වූයේ කවර හේතුවක් නිසා ද?

(ii) මහත් සම්පත් ඇතත් ඒවා වියදම් කිරීමට ඇති මැළිකම දැක්වීමට යොදා තිබෙන උපමාව කුමක් ද?

(iii) 'ආභරණ කරවන්ට බඩාල් කෙනකුන් ගෙනාවොත් ...' මෙය ලිහිල් බසින් ලියන්න.

(iv) '**නැතක් වී සාල්**' යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04 යි.)

**(ආ)** එනුවර අසුකෙළක් ධන ඇති සිටාණන්ගේ සිටුදේවීන්ට ශීර්ෂාබාධයක් ඇතිව සත් අවුරුද්දක් මුළුල්ලෙහි මහත් වූ ව්‍යසන විය. දඹදිව බොහෝ වෛද්‍යාචාර්යවරයෝ "අපි සන්සිඳුවම්හ, අපි සන්සිඳුවම්හ" යි වාසි කියකියා අවුත් නොයෙක් පිළියම් කොට සම්පත් ගෙන යන්නාහුය. **ශීර්ෂාබාධය** ඇසිල්ලකත් සන්සිඳුවාලිය නුහුණුවාහුය. ජීවකයෝ එපවත් අසා ඒ සිටාණන්ගේ සත්වැනි වාසලට ගොස් සිට වෛද්‍යයෙහි බලවත් ආචාරිකෙනෙක් වාසල සිටියෝයයි කියා යවූහ. සිටුදේවී එපවත් අසා ජීවකයන්ගේ වයස් විචාරා බාලදරුකෙනෙකැයි අසා සිනාසී "දඹදිව ප්‍රසිද්ධ ආචාරිවරහු අවුත් මා ඇසිල්ලකුත් නිදවාපිය නුහුණුවහ. කිරි බොන තරම් බාලදරුකෙනෙක් කුමක් කෙරෙද්ද"යි කියා "තමන් බඩ සා වුවහොත් බත් ලවාගෙන කන්ට කියව. අනික් කිසි අඑාසුවෙක් ඇත් නම් ඉල්වාගෙන යන්ට කියව. නන් නොදොඩා ආ පස්සෙහි යන්ට කියව"යි කියා යවූහ.

(i) බොහෝ වෛද්‍යවරුන් කළ කාර්යය කුමක් ද?

(ii) සිටු දේවිය, බාල දරු කෙනකුන් ලෙස සැලකූ තැනැත්තා කවරෙක් ද?

(iii) 'මා ඇසිල්ලකුත් නිදවාපිය නුහුණුවහ ...' මෙය ලිහිල් බසින් ලියන්න.

(iv) '**ශීර්ෂාබාධය**' යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04 යි.)

[දෙවැනි පිටුව බලන්න.

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

(ඉ) ගන්ධාර දේශයෙහි තක්සලා නුවර දිසාපාමොක් ආචාරීන් සමීපයට බ්‍රාහ්මණ කුමාරයෙක් ගොස් සියලු ශිල්ප ඉගෙන ඉනුත් ධනුශ්ශිල්පය නිමවා උගත, දිසාපාමොක් ආචාරී **සමාධි ව** බ්‍රාහ්මණ කුමාරයන්ට 'චුල්ල ධනුර්ධර' කුමාරයෝය යි නම් තබා තමන්ගේ වැඩිහිටි දුවණියන් පාවා දුන්හ. චුල්ලධනුද්ධරයෝ තමන්ගේ බිරින්ද කැඳවා ගෙන මාවතෙක යන්නාහු වනාන්තරයකට පැමිණියාහ, ඒ වනාන්තරයේ භයංකර වූ ත්‍රිමදගලිත හස්තියෙක් ඇත. ඒ හස්තියා ධනුද්ධරයන් දැක දිවගෙන ආය. චුල්ලධනුද්ධරයෝ පඤ්චායුධ සන්නද්ධ ව ඒ දඬු පන් සියයකුත් ඇරගෙන යන්නාහු හස්තියා දිවගෙන එන්නා ඒ දණ්ඩක් ඇද පියා ඇරගෙන විද්දාහු වාත කුම්බයෙන් විද පලවා ඇතා එතන ම එළා නික්මුණු කලට, අනික් වනාන්තරයක සොරුන් පන් සියයක් දඩ මස් පුළුස්සා කන කලට චුල්ලධනුද්ධරයෝ එතනට පැමිණ තමන් බිරින්දට කියන්නාහු "දඩ මස් පුළුස්සා කන මිනිසුන් උන් තෙනට ගොස් දඩ මස් ඉල්වා ගෙන එව"යි කියා යවූහ.

(i) බ්‍රාහ්මණ කුමාරයාට "ධනුර්ධර" යන නම තැබූයේ කවර හේතුවක් නිසා ද?

(ii) චුල්ලධනුද්ධරයන් තම බිරිඳ පන්සියයක් සොරුන් ඉදිරියට යැවූයේ කුමක් පිණිස ද?

(iii) "ඒ වනාන්තරයේ භයංකර වූ ත්‍රිමදගලිත හස්තියෙක් ඇත." මෙය ලිහිල් බසින් ලියන්න.

(iv) '**සමාධි ව**' යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04 යි.)

(ඊ) එකල්හි ඒ චණ්ඩාල බ්‍රාහ්මණයා "එසේය දේවයන් වහන්ස, මාගේ ස්වර්ණ තිලකා නම් වූ දූ තොමෝ ජාතිසම්පන්න කුලපුත්‍රයන් මිස සෙස්සවුන් නොකැමැත්තීය"යි කීය. එබස් අසා රජ්ජුරුවෝ "එම්බල සගය, එසේ වී නම් පඤ්චමධුරා නම් නුවර උද්දාල නම් බමුණෙක් වෙසෙයි; ඒ බ්‍රාහ්මණයා ඉතා ජාති සම්පන්නය; මවුපිය දෙපක්ෂයෙන් ම **අනින්දිතය**, ස්ත්‍රීන් දුටු කල්හි මොහු ජුගුප්සා කටයුතු වූ ඉතා පිළිකුල් ජාතියෙකැ" යි නින්දා බැණ ඔවුන් හා සහවාසය නොකෙරෙයි; තමා වසන ගෙන් නික්ම රජගෙට යන එන වේලෙහි කිරිපැන් සොළොස් කළයක් මගදිග ඉස්වයි; ගැහැණුන් දුටු කල කාළකණ්ණියක දකපිම් යි කිරිපැනින් මුහුණ ශුද්ධ කෙරෙයි; එබැවින් තාගේ දූ සමර්ථ වූ නම් ඒ බමුණා හා සහවාසය කෙරේව යි මෙසේ මා කී ලෙස ම තාගේ දුවට කියා බලගැ" යි කීහ.

(i) උද්දාල බ්‍රාහ්මණයා ස්ත්‍රීන් දුටු කල මුහුණ දොවන්නේ මොනවායින් ද?

(ii) චණ්ඩාල බ්‍රාහ්මණයා තමන්ගේ දුව හඳුන්වා ඇත්තේ කවර ආකාරයකින් ද?

(iii) "කිරිපැන් සොළොස් කළයක් මග දිග ඉස්වයි." මෙය ලිහිල් බසින් ලියන්න.

(iv) '**අනින්දිතය**' යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04 යි.)

(උ)

පිරි සිලිලෙන් පෙනෙ න
මහඋර මහත් සැපති න
එපුර ගිලෙතෙයි දැ න
බඹා ලූ තර වළල්ලක් මෙ න

පිරි සියපත් රොන ට
පුරෙහි වත් සුණු සුවඳ ට
හැසිරෙන බමර ව ට
හෙළු. මිණිදැල් වැන්න **අරක ට**

(i) පළමු වන පද්‍යයෙන් වර්ණනයට ලක් වූ නගරාංගය කුමක් ද?

(ii) දෙ වන පද්‍යයෙන් දැක්වෙන උපමාව හා උපමේය වෙන් කොට දක්වන්න.

(iii) "පිරි සිලිලෙන් පෙනෙන මහඋර" මෙය ලිහිල් බසින් ලියන්න.

(iv) "**අරකට**" යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04 යි.)

[තුන්වැනි පිටුව බලන්න.

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

www.AlevelApi.com



● **(ඌ)** සහ **(එ)** ප්‍රශ්න **දෙකට ම** පිළිතුරු සපයන්න.

**(ඌ)** පහත සඳහන් උද්ධෘත අතුරෙන් **හතරක** අවස්ථා සම්බන්ධය දක්වන්න.

(i) "මා අවසර නැත. අනික් වෙදකෙනකුන් ගෙන්වා පිළියම් කරවනබව ය."

(ii) "මාගේ බුදුන්ට මතු පිළියම් කරන වෙදහුට මම ආචාරි වෙමි. "

(iii) "මෙතැන්හි නො වසව, පර්වතයෙන් බැස මිනිසුන්ට විසය තැන නොවෙසෙත්ව."

(iv) "සියලු දිගන්තරය අන්ධකාර වූවාක් මෙන් චලිත ව වැටහෙයි; දැන් මට පිළිසරණ ව සංග්‍රහකරව."

(v) "ඒක වෙන ම කතාවක් නෙ? ඔය කුණු ගොඩ අත්හැර දාලා කසාදයක් බඳින්ඩ උඹට හොඳ කාලෙ දැන්"

(vi) "වැදගත් හැම සිදුවීමක් ම මේ පොතේ ලියන්න ඕන තේරුණාද?"

(vii) "කවි නළු රස බ්‍රහ්මාස්වාදයට සරිය." (ලකුණු 03 × 4 = 12 යි.)

**(එ)** පද්‍ය නිර්මාණයක සාර්ථකත්වය උදෙසා කාව්‍ය අන්තර්ගතය හා භාෂා භාවිතය ඉවහල් වන ආකාරය අවධානයට ගෙන පහත දැක්වෙන කාව්‍ය නිර්මාණය පිළිබඳ රසාස්වාදයක් කරන්න.

**රන් තැටියක කඳුළු**

මා පමණි ඔබ කැටුව ආවේ
මම ද යමි දියණියනි
මොහොතකින් සඳ ඒවි තනියට
රන් තැටිය පුරවා කඳුළින්

මෙතෙක් ලොව නො ඇසුව
මියුරු නැළවිලි ගී
ළයට කැටි කොට තිඳයි ඔබෙ මව
අවදිවන ඇසිපියෙන්
බිඳී සුන් වන ලොවක.
බිහි නොවූ හෙට දවස
ඇය නොදත් රහස දැන
කාලයේ ගැබ තුළෙහි
ඉකි බිඳියි කම්පාව.

දස එකඩ මසක් ඈ රැකි
සෙනෙහසේ නිධානය
වෙස් මුහුණු තුළට වූ බහිරවයින්
නුහුරු බස් තෙපළමින්
වට වෙමින් අඬු තියෙන්
පැහැර සඟවන අතර,
බලා සිටියෙමි කොනක
ගොළු වෙමින් අසරණව.

සෙමෙන් තව තව සෙමෙන්
පස් පිඩැලි පෙරළන්න
මවගෙ ඇකයෙහි පහස
නො දත් දැරියකි සිඟිති.

කිරි ගරුඬ කොත් හෙළන
අඳුරු සෙවණැලි අතර
නුහුරු නුපුරුදු ලොවක
සැතපෙන්න දියණියනි.

මොහොතකින් සඳ ඒවි තනියට
රන් තැටිය පුරවා කඳුළින්. (ලකුණු 12 යි.)

[හතරවැනි පිටුව බලන්න.

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**2.** මනුෂ්‍යයන්ගේ චින්තන ක්‍රමය සහ ඊට අනුගත ව ක්‍රියාත්මක වන හැසිරීම් රටාව පිළිබඳ ව ධර්මසේන හිමියන් සතු ව පැවති විඥානය සද්ධර්මරත්නාවලියේ කථා වස්තු අර්ථවත් වීමට හේතු වී තිබේ දැයි නිර්දිෂ්ට කථා ආශ්‍රයෙන් විමසන්න.

**නැත හොත්**

"කථා ශරීරයට ප්‍රමුඛ ස්ථානය ලබා දීමත් වර්ණනීය අවස්ථා සංක්ෂිප්ත ලෙස දැක්වීමත් ජාතක කථා රචනා රීතියේ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණයකි." නිර්දිෂ්ට ජාතක කථා ආශ්‍රයෙන් විමසන්න. (ලකුණු 15 යි.)

**3.** පහත (අ) කොටසේ ප්‍රශ්නය සහ (ආ) කොටසින් තවත් එක් ප්‍රශ්නයක් ද තෝරා ගෙන පිළිතුරු සපයන්න.

(අ) "දඹදෙණි, ගම්පළ අවධිවල ද මෙරට ගද්‍ය කාව්‍ය රචකයෝ ජනකාන්ත ධර්ම දේශනා රීතියෙන් බැහැර නො වූහ." උදාහරණ සහිත ව පරීක්ෂා කරන්න. (ලකුණු 07 යි.)

(ආ) සද්ධර්මාලංකාර කතුවරයා කාමයෙහි ආදීනව ප්‍රකට කිරීම සඳහා කාම් සංකල්පවලින් විසිතුරු වූ රසවත් සිද්ධි ඇතුළත් කථාන්තර උපයෝගී කොට ගෙන ඇති ආකාරය නියමිත කථා වස්තු ඇසුරෙන් පැහැදිලි කරන්න.

**නැත හොත්**

"කුශලාකුශල කර්ම ඵල විපාක, සිත් ඇද ගන්නා ලෙස යොදා ගැනීම නිසා පූජාවලිය ජනප්‍රිය භක්ති කාව්‍යයක් වී තිබේ." නිර්දිෂ්ට කථා වස්තුවලින් ගත් නිදසුන් ඇසුරෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 08 යි.)

**4.** "වැත්තෑවේ හිමියන් ගුත්තිල කාව්‍යය සඳහා වස්තු විෂය කර ගත්තේ අතීත කථා ප්‍රවෘත්තියක් වුව ද වර්තමාන පාඨකයාට ද කාල භේදයකින් තොර ව එයින් රසාස්වාදයක් ලබා ගත හැකි ය." විමර්ශනයට ලක් කරන්න.

(ලකුණු 15 යි.)

**5.** "නීතියේ සමානත්වය අභියෝගයට ලක් වීම හේතුවෙන් අසීමාන්තික ලෙස පීඩාවට පත් වූ ජන කොට්ඨාසයක් බැද්දේගම නවකථාවෙන් නිරූපණය කෙරේ." නිදසුන් **තුනක්** වත් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 15 යි.)

**6.** කෙටිකතාවක චරිත නිරූපණය යන්න පැහැදිලි කොට, ඒ. වී. සුරවීරගේ අකුරට යන වෙලාවේ කෙටිකතාවෙහි චරිත නිරූපණය එහි සාර්ථකත්වයට ඉවහල් වී තිබේ දැයි විමසන්න. (ලකුණු 15 යි.)

**7.** කොළඹ කවියේ ද්විතීය තරංගය/අවධිය නියෝජනය කළ පද්‍ය රචකයන් ස්වභාව සෞන්දර්යය විචිත්‍ර ආකාරයෙන් දුටුවන් ලෙස සැලකිය හැකි දැයි ඔබට නියමිත නිර්මාණවලට අදාළ නිදසුන් **තුනක්** වත් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 15 යි.)

**8.** "තම සිතැඟි පාසෙට ගොදුරු වූ මනුෂ්‍යයෝ නොයෙක් ව්‍යසනයන්ට පත් වෙති." පෙමතො ජායතී සොකො නාට්‍යය ඇසුරෙන් මේ ප්‍රකාශයේ සත්‍යාසත්‍යතාව පරීක්ෂා කරන්න. (ලකුණු 15 යි.)

* * *

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

www.AlevelApi.com



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Adv. Level) Examination, 2021(2022)

සිංහල II
சிங்களம் II
Sinhala II

71 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.**

**විභාග අංකය** : ..........................

**උපදෙස්:**

- ※ **I** කොටසේ **1** ප්‍රශ්නය ද, **II** කොටසේ **2, 3** ප්‍රශ්න ද, ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
- ※ **1** ප්‍රශ්නයේ ඇති **සියලු ම** අනුකොටස්වලට මේ **ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.
- ※ **I** කොටස, **II** කොටසේ පිළිතුරු පත් සමග **අමුණා භාර දෙන්න.**

## I කොටස

**1.** එක් එක් ප්‍රශ්නයට වඩාත් ම ගැළපෙන පිළිතුර තෝරා ගෙන, **එයට හිමි අංකය වරහන තුළ ලියන්න.**

1.1 'කහ' යන්නෙහි අන්තර්ගත ව්‍යඤ්ජනවල උත්පත්ති ස්ථානය වනුයේ,
(1) දන්තජ ය. (2) ඕෂ්ඨජ ය. (3) කණ්ඨජ ය. (4) මූර්ධජ ය. (5) තාලුජ ය. (......)

1.2 නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පද පේළිය තෝරන්න.
(1) අරුණළු, අබිනික්මණ, සනීභවණය, සැණකෙළි, කාළගුණය
(2) අරුණලු, අබිනික්මන, සනීභවනය, සැණකෙළි, කාලගුණය
(3) අරුනලු, අභිනික්මණ, ගණිභවනය, සැනකෙළි, කාලගුනය
(4) අරුණලු, අබිනික්මන, සණීබවනය, සැණකෙලි, කාළගුණය
(5) අරුනළු, අබිණික්මන, ගනීභවනය, සැණකෙළි, කාලගුණය (......)

1.3 අකාරාදි පිළිවෙළ අනුව නිවැරදි ව ලියා ඇති පද පේළිය තෝරන්න.
(1) දඹදෙණි, කුරුණෑගල, කෝට්ටේ, ගම්පොළ
(2) කෝට්ටේ, ගම්පොළ, කුරුණෑගල, දඹදෙණි
(3) කුරුණෑගල, දඹදෙණි, කෝට්ටේ, ගම්පොළ
(4) කෝට්ටේ, දඹදෙණි, ගම්පොළ, කුරුණෑගල
(5) කුරුණෑගල, කෝට්ටේ, ගම්පොළ, දඹදෙණි (......)

1.4 පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) රකාරාංශය වෙනුවට රේඵය ද, රේඵය වෙනුවට රකාරාංශය ද යෙදිය හැකි ය.
(2) 'ර්' යන්නට රකාරාංශය එකතු කළ හැකි ය.
(3) වචනයක ආරම්භයේ රකාරාංශය නො යෙදේ.
(4) රකාරාංශය හා රේඵය යෙදෙන ආකාරය සමාන ය.
(5) රකාරාංශය සිංහල භාෂාවේ ස්වාධීන අක්ෂරයකි. (......)

1.5 එකිනෙකට අනුරූප වන සේ වචන යුගල යෙදී ඇති වරණය තෝරන්න.
(1) මාර්ගගත දේශන, ගුරු වැඩවර්ජන, මහාජන ආරක්ෂාව, සිසු සවිය
(2) වැටුප් විෂමතා, මර්දන නීති, විෂබීජ හරණ, සෞඛ්‍ය පරීක්ෂක
(3) වෛද්‍ය අධිකාරී, රෝහල් පරිශ්‍රය, මෙහෙයුම් මධ්‍යස්ථාන, වසංගත රෝග
(4) නිරෝධායන මධ්‍යස්ථාන, ජනමාධ්‍ය වාරණ, ආරක්ෂක විධිවිධාන, රෝග නිවාරණ
(5) වෛද්‍ය වෘත්තිය, මානසික ආතතිය, ගැටලු නිරාකරණය, පුවත්පත් නිවේදන (......)

[දෙවැනි පිටුව බලන්න.

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

1.6 තත්සම පද පමණක් යෙදී ඇති වරණය කුමක් ද?
(1) ධරණී, බන්ධන, ප්‍රතිඵල, මල්පල (2) යක්ෂ, දක්ෂ, පක්ෂ, වෘක්ෂ
(3) රංග, අඟ, සංඝ, අංග (4) ප්‍රවර, පවුර, ප්‍රබල, ප්‍රධාන
(5) කාල, තාල, කැල, මාල (......)

1.7 තද්භව වචන පමණක් අන්තර්ගත වරණය තෝරන්න.
(1) වෙහෙර, ප්‍රහාර, වහර, කතර (2) මිත්, සිත්, ගීත, ගීත
(3) වක, සුබ, සක, මුබ (4) අරණ, වර්ණ, තොරණ, කර්ණ
(5) පමණ, බමන, පහණ, පරණ (......)

1.8 විශේෂණ පූර්ව පද, උපමාන පූර්ව පද, සංඛ්‍යා පූර්ව පද හා විශේෂණ අපර පද යන සමාස පද අනුපිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.
(1) සුදුරෙද්ද, තිසරතන, නවමහල්, පැරකුම්රජ
(2) තිසරතන, නවමහල්, පැරකුම්රජ, සුදුරෙද්ද
(3) සුදුරෙද්ද, පැරකුම්රජ, නවමහල්, තිසරතන
(4) පැරකුම්රජ, නවමහල්, තිරසතන, සුදුරෙද්ද
(5) නවමහල්, සුදුරෙද්ද, පැරකුම්රජ, තිසරතන (......)

1.9 කෘදන්තයක් **නො වන** පදයක් අන්තර්ගත වරණය තෝරන්න.
(1) ඇඹැරූ, වැමැරූ, පැහැරූ, වැහැරූ (2) ඇල්ලූ, දැල්ලූ, හෙල්ලූ, ඉල්ලූ
(3) නැම්ලි, කිහිලි, කිම්දිලි, කිවිසිලි (4) විසුමන්, පිසුමන්, නැසුමන්, දෙසුමන්
(5) මළ, වදාළ, කළ, මතුළ (......)

1.10 පහත දැක්වෙන උද්ධෘතවල **තද කළු අකුරෙන්** මුද්‍රිත පද අයත් ක්‍රියා වර්ගය පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.
(අ) "**නිදන්න** පුත රන්කිරි"
(ආ) "ආයු බෝ **වේවා**"
(ඉ) "දත් **මැදලා** දමන"
(ඊ) "**අසමින්** කවි ගී සින්දු"
(1) මිශ්‍ර ක්‍රියා, ආශීර්වාද ක්‍රියා, විධි ක්‍රියා, පූර්ව ක්‍රියා
(2) ආශීර්වාද ක්‍රියා, විධි ක්‍රියා, පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා
(3) පූර්ව ක්‍රියා, විධි ක්‍රියා, ආශීර්වාද ක්‍රියා, මිශ්‍ර ක්‍රියා
(4) විධි ක්‍රියා, ආශීර්වාද ක්‍රියා, පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා
(5) විධි ක්‍රියා, ආශීර්වාද ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා (......)

1.11 තද්ධිතයක් **නො වන** පදයක් අන්තර්ගත වරණය තෝරන්න.
(1) අරටු, කැහැටු, බොකුටු, වකුටු
(2) දිරිමත්, සිරිමත්, ඉසුරුමත්, රූමත්
(3) පාපතම, මධුරතම, උත්තම, ජ්‍යෙෂ්ඨතම
(4) ගුණවන්ත, කරුණාවන්ත, බලවන්ත, ඥානවන්ත
(5) වෙරළත, ලවනත, සවනත, මුහුණත (......)

1.12 උපසර්ගයක් යෙදී නැති පදයක් සහිත පද පේළිය තෝරන්න.
(1) නිර්ලෝභ, නිර්ධන, නිරුත්සාහක, නිරුදක
(2) දුදන, දුබල, දුසිරිත්, දුසිල්
(3) ඉමහත්, ඉපැරණි, ඉම්හිරි, ඉබොහෝ
(4) අභිමාන, අභියෝග, අභියාචන, අභිධර්ම
(5) සුනිමල්, සුපසන්, සුවහස්, සුමඟුල් (......)

1.13 නිපාතයක් **නො වන** පදයක් අන්තර්ගත වරණය තෝරන්න.
(1) විතර, පමණ, විපුල, තරම් (2) නිති, නිබඳ, නිතර, නිරතුරු
(3) තෙක්, දක්වා, තුරු, පටන් (4) එම්බා, එම්බල, බොල, කොල
(5) සඳහා, පිණිස, වස්, තකා (......)

[තුන්වැනි පිටුව බලන්න.

alevelapi.com

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

1.14 "සෞඛ්‍ය සේවාවේ **බුද්ධිමත්හු** කෝවිඩ් මර්දනය කිරීමෙහි ලා **නිරෝධායන** නීති ද **සංවරණ** සීමා ද පනවති." යන වාක්‍යයෙහි වචන යෙදී ඇති පිළිවෙළ අනුව **තද කළු අකුරෙන්** ඇති පද අයත් වන්නේ කුමන ව්‍යාකරණ අංගවලට ද?

(1) උපසර්ග, තද්ධිත, සන්ධි (2) සන්ධි, තද්ධිත, උපසර්ග
(3) තද්ධිත, සන්ධි, උපසර්ග (4) උපසර්ග, සන්ධි, තද්ධිත
(5) සන්ධි, උපසර්ග, තද්ධිත (......)

1.15 සමාන ව්‍යාකරණ ලක්ෂණ නිරූපණය කරන ක්‍රියා රූප සහිත වරණය තෝරන්න.

(1) අල්ලන්නේ ය, සොල්ලන්නේ ය, හුල්ලන්නී ය, ඉල්ලන්නේ ය
(2) කවති, දෙවති, අල්ලති, නාවති
(3) දුවනු, බැලෙනු, නටනු, ලියනු
(4) හෙළුවෝ ය, නෙළුවෝ ය, පෙළුවේ ය, තැළුවෝ ය
(5) ඇන්නා ය, පැන්නා ය, දුන්නා ය, බැන්නා ය (......)

1.16 සමාසයක් **නො වන** පදයක් ඇතුළත් වරණය තෝරන්න.

(1) අනර්ථ, අන්ධකාර, අමනෝඥ, අදූරදර්ශී
(2) මහලුමඩම, දේවදූතයා, අලිසෙල්ලම, මුවහම
(3) රටජාතිය, ගුණාගුණ, නැන්දමාමා, බලුබළල්
(4) නිවැරදි, නිසොල්මන්, නිතරඟ, නිදුක්
(5) යොවුන්මදය, පෙම්ගඟුල, හදවිල, තරුවියන (......)

1.17 එක ම වර්ගයට අයත් සන්ධි පද ඇතුළත් වරණය තෝරන්න.

(1) අල්ලස්, අංකොට, අද්දැකීම්, අස්සන
(2) සනාන්ධකාර, අන්ධානුකරණය, ස්වර්ගෝත්පත්ති, වර්ගාක්ෂර
(3) බහූපකාර, හිතෝපදේශ, ක්‍රිස්තුත්පත්තිය, ගුරූපදේශ
(4) මංමුළා, මංපහරන්නා, ගංදිය, අංකෙළිය
(5) රුක්කත්තන, පොල්ලත්ත, සද්දවස, කොස්සැට (......)

1.18 ව්‍යාකරණානුකූල ව **නො ගැළපෙන** වරණය කුමක් ද?

(1) අපවාද, අපචාර, අපයෝජන, අපහරණ
(2) සරන, දරන, වරන, උරන
(3) මැටිපහන්, ගල්මෝල, යකඩබඩු, වේවැල්පුටු
(4) නටව, දුවව, බලව, කපව
(5) ඖදාර්ය, ඖචිත්‍ය, කෞශල්‍ය, සෞන්දර්ය (......)

1.19 ව්‍යාකරණානුකූල ව නිරවද්‍ය වාක්‍යය තෝරන්න.

(1) සත්පුරුෂයන් ලෝකය සුවපත් කරති.
(2) කොවිඩ් 19 නොහොත් කොරෝනා රෝගය ලක්ෂ ගණනකගේ ජීවිත බිලිගෙන ඇත.
(3) විශ්‍රාමික ගුරුවරයෙක් වූ නැණපාල මහතා සමාජ සේවකයෙක් ද වෙයි.
(4) ඒ වලව්වේ හාමු මහතා ධනවතෙක් ද බලවතෙක් ද ගුණවතකු ද විය.
(5) රෝග වැළැක්වීමේ කාර්යයේ දී වගකිවයුත්තෝ සෞඛ්‍ය බලධාරීහු ය. (......)

1.20 ලේඛන ව්‍යවහාරයට වඩාත් සුදුසු වාක්‍යය සහිත වරණය තෝරන්න.

(1) යන්තම් ඇති ඒ මර උගුලෙන් නං බේරුණා.
(2) තමාගේ ජීවිතයේ අනාගතය තමා ම සැලසුම් කළ යුතු ය.
(3) ඔන එකෙක් ගිය දෙන්, මගේ මොකෝ?
(4) හිමින් සීරුවේ ඇවිල්ල පිළිකන්න පැත්තෙන් ගෙට රිංගුවා.
(5) තාන්න මාන්න ලැබුණයි කියලා හිත හොඳ නැත්තං වගතුවක් වෙන්නෑ. (......)

(ලකුණු 20 යි.)

* *

[හතරවැනි පිටුව බලන්න.

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Adv. Level) Examination, 2021(2022)

| | |
|---|---|
| සිංහල | II |
| சிங்களம் | II |
| Sinhala | II |

71 S II

## II කොටස

- මෙම කොටසින් **2, 3** ප්‍රශ්න ඇතුළු ව ප්‍රශ්න **සතරකට** පමණක් පිළිතුරු සපයන්න.

**2.** (අ) පහත සඳහන් පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

මෙරට කෘෂිකර්මාන්තය සමග අනිවාර්යයෙන් එකට බැඳී පැවති තවත් කර්මාන්තයක් වූයේ පශු සම්පත් පාලනය යි. අනුරාධපුර මුල් යුගයේ පටන් ම සත්ත්ව පාලනය කෙතරම් දුරට සංවිධානාත්මක ව පැවතියේ ද යන්න සෙල්ලිපිවල සඳහන් වන, ඒවා පිළිබඳ වගකියන කාර්යාංශ පිහිටුවා තිබීම සම්බන්ධ තොරතුරුවලින් අනාවරණය වේ. ඈත අතීතයේ සිට ගොවිතැන් කටයුතුවල දී විශේෂයෙන් ගවයා හා මී ගවයා අත්‍යවශ්‍ය සම්පතක් වූයෙන් හෙළදිව විසූ පැරැන්නන් මහත් ඕනෑකමින් ගව සම්පත රැක බලා ගැනීම සිදු කළ බවට සාක්ෂ්‍ය ඇත. ගවයා හා මී ගවයා ගොවිපළෙහි ප්‍රධානතම සහායකයා වූ අතර, භාණ්ඩ ප්‍රවාහනයේ දීත් තවලම් හා කරත්ත ඇදගෙන යාමේ දීත් ප්‍රධාන ප්‍රවාහකයා බවට පත් විය. පස්ගෝරස දේශීය ආහාර රටාවේ අතිශය වැදගත් අංගයක් විය. ගොවිපළට අවශ්‍ය ගොම පොහොර සැපයුණේ ද ගවයින්ගෙන් ම ය. මේ ආකාරයට ගවයා ජීවන සහකරුවකු බවට පත් වීම නිසා මිනිස්සු ස්වේච්ඡාවෙන් ම ගවයින් රැක බලා ගැනීමේ කාර්යයෙහි නිරත වූහ. අශ්ව ප්‍රජාව ද, මෙරට මිනිසුන්ගේ ජන ජීවිතයට බෙහෙවින් ම අනුබල දැක්වූ සත්ත්ව කොට්ඨාසයකි. විශේෂයෙන් ම ප්‍රභූ පාන්තිකයන්ගේ ගමන්බිමන්වල දී අශ්වයාගේ දායකත්වය අනිවාර්ය විය.

අලි-ඇතුන් හා ඇද්දළ අතීතයේ මෙරට ප්‍රධාන අපනයන භාණ්ඩ බවට පත් ව තිබිණි. බරවැඩ කිරීමේ දී මෙන් ම ඉදිකිරීම්වල දී ද අලි-ඇතුන්ගේ සහාය ලබා ගැනිණි. අලි රැක බලන්නන්, ප්‍රතිකාර කළ වෛද්‍යවරුන් සහ ගජනායක නිලය දක්වා අලි-ඇතුන් සම්බන්ධ කාර්යාංශ දියුණුවට පත් ව පැවති ආකාරය මහනුවර සමයේ සමාජ සංවිධානය පිළිබඳ තොරතුරුවලින් සනාථ වේ. පැරැන්නන් පශු සම්පත් පාලනය පිළිබඳ දැක්වූ බලවත් උනන්දුව වඩාත් කැපී පෙනෙන්නේ සතුන් මැරීම තහනම් කිරීමෙන්, මස් කෑමෙන් වැළකී සිටීමෙන් පමණක් නො ව මෙවන් වැරදි කරන අයට බරපතළ දඬුවම් ද පැමිණවීමෙනි. දහ වන සියවසට අයත් වේවැල්කැටිය සෙල්ලිපියේ සඳහන් වන ආකාරයට හතර වන මිහිඳු රජතුමා විසින් ගවයන් හා එළුවන් මරන්නන්ට මරණ දඬුවම් පමුණුවනු ලැබ තිබේ. මේ අනුව නිගමනය කළ හැකි වන්නේ පැරැන්නන් ඔවුන්ගේ ආර්ථිකය ශක්තිමත් කර ගැනීම සඳහාත් වෙනත් විවිධ අවශ්‍යතා සපුරා ගැනීම සඳහාත් කිසියම් විධිමත් ක්‍රමවේදයකට අනුව පශු සම්පත් පාලනයේ නිරත ව ඇති බව ය.

(i) ඉහත ලේඛනයට අනුව පශු සම්පත් පාලනය පිළිබඳ පැරැන්නන් දැක්වූ බලවත් උනන්දුව කැපී පෙනෙන්නේ කවර කාරණාවල දී ද?

(ii) හතර වන මිහිඳු රජතුමාගේ සෙල්ලිපියේ දැක්වෙන පරිදි මරණ දඬුවම පමුණුවා ඇත්තේ කවුරුන්හට ද?

(iii) අලි-ඇතුන් සම්බන්ධයෙන් මෙරට පැවති නිලය කුමක් ද?

(iv) මෙහි දැක්වෙන පරිදි දේශීය ආහාර රටාවේ අතිශය වැදගත් අංගය වූයේ කුමක් ද?

(v) අලි-ඇතුන්ගේ සහාය ලබා ගත්තේ කවර කටයුතු සඳහා ද?

(vi) අශ්වයන්ගේ දායකත්වය අනිවාර්ය වූයේ කවර අවස්ථාවක දී ද?

(ලකුණු 02 × 6 = 12 යි.)

[පස්වැනි පිටුව බලන්න.

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

www.AlevelApi.com



(ආ) පහත දැක්වෙන උද්ධෘතය කියවා, එහි වචන සංඛ්‍යාව **තුනෙන් එකක් පමණ වන සේ** සාරාංශ කොට ලියා, සාරාංශය අග වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

සෞඛ්‍ය අංශයේ දැනට අත්කරගෙන ඇති ප්‍රගතිය තව දුරටත් ශක්තිමත් කිරීමට මෙන් ම සෞඛ්‍ය සේවා ලබා ගැනීම සඳහා සැමට සම අවස්ථා ලබා දීම හා ප්‍රාදේශීය වශයෙන් පවතින විෂමතා අඩු කිරීම කෙරෙහි යොමු වූ සෞඛ්‍ය ප්‍රතිපත්තියක් පවත්වා ගෙන යාමට රජය කැප වී සිටියි. ඒ අනුව, බෝ වන රෝග හා බෝ නො වන රෝග පැතිරීම අඩු කිරීම මගින් ආයු අපේක්ෂාව තව දුරටත් ඉහළ නැංවීම සහ වැළැක්විය හැකි රෝග අඩු කිරීම මගින් ජීවිතවල ගුණාත්මකභාවය ඉහළ නැංවීම සෞඛ්‍ය ප්‍රතිපත්තියේ පුළුල් අරමුණ වී ඇත. වතු, දුෂ්කර ග්‍රාමීය ප්‍රදේශ, ගැටුම්වලින් පීඩාවට පත් ප්‍රදේශ හා ව්‍යසනවලට භාජන වූ ප්‍රදේශවල සිටින අඩු ආදායම්ලාභී ජනතාවට සෞඛ්‍ය සේවා ලබා ගැනීම සඳහා වන ප්‍රවේශය වැඩි කිරීම සඳහා නම්‍යශීලී සෞඛ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය කළ යුතු ව ඇත. මේ අරමුණු ළඟා කර ගැනීම පිණිස සෞඛ්‍යය සඳහා වන ගබඩා ඒකක හා ප්‍රජා සහභාගිත්වය ශක්තිමත් කිරීම, සෞඛ්‍ය සේවා සැපයීම වැඩි දියුණු කිරීම, සෞඛ්‍ය භාරකාරිත්වය හා කළමනාකරණය වැඩිදියුණු කිරීම, මානව සම්පත් කළමනාකරණය වැඩිදියුණු කිරීම සහ සම්පත් බෙදා හැරීම හා උපයෝජනය සෞඛ්‍ය මූල්‍ය සම්පත් වැඩිදියුණු කිරීම යන ප්‍රධාන අංශ පහකින් සමන්විත උපාය මාර්ගික සෞඛ්‍ය සංවර්ධන සැලසුමක් සකස් කොට ඇත.

ද්විතීයික හා තෘතීයික සෞඛ්‍ය සේවා සපයන්නන් මත ඇති වන පීඩනය අඩු කිරීම සඳහා දැනට පවතින ප්‍රාථමික මට්ටමේ සෞඛ්‍ය සේවා පද්ධතිය ශක්තිමත් කිරීම අතිශයින් වැදගත් වේ. රෝගීන් ප්‍රාථමික සෞඛ්‍ය සේවා සපයන්නන්ගෙන් සේවා ලබා ගැනීමෙන් වැළකී උසස් මට්ටමේ රෝහල්වලින් හෝ පෞද්ගලික විශේෂඥ වෛද්‍යවරුන්ගෙන් හෝ සේවා ලබා ගැනීම වර්තමානයේ දක්නට ලැබෙන ප්‍රවණතාවකි.

(ලකුණු 13 යි.)

**3.** දී ඇති මාතෘකාවලින් **එකකට** අදාළ ව වචන **300-350** අතර වන සේ විශ්ලේෂණාත්මක රචනාවක් ව්‍යාකරණානුකූල ව ලියන්න.

(i) විචාරශීලී හා සංවේදී පුද්ගලයකු බිහි කිරීමෙහි ලා සාහිත්‍ය සේවනයෙන් සැපයෙන පිටුබලය

(ii) ස්ථිරසාර කෘෂිභෝග සංවර්ධන ව්‍යාපෘති දියත් කිරීමේ දී ශ්‍රී ලංකාවට මුහුණ පෑමට සිදු වන අභියෝග

(iii) සමුද්‍රීය පරිසර සංරක්ෂණය සඳහා යොදා ගත හැකි ප්‍රායෝගික ක්‍රමෝපාය

(iv) නෛතික පියවර මෙන් ම මානව ආකල්ප සංවර්ධනය කිරීමෙන් ද සුරක්ෂිත විය යුතු ළමා අයිතිවාසිකම්

(v) බලවතුන් අතර හටගැනෙන යුද ගැටුම් හේතුවෙන් පීඩාවට පත් වන ගෝලීය ප්‍රජාව

(ලකුණු 25යි.)

**4.** (අ) පහත සඳහන් වාක්‍යවල සදොස් තැන් ඇතොත් නිදොස් කොට ලියන්න.

(i) අමාලි හෝ අමල් හෝ අමිලා හෝ ගමට යන්නේ ය.

(ii) සියලු සිවුපා සත්තු හිංසාකාරීහු නො වෙති.

(iii) ප්‍රකට දාර්ශනිකයෙක් වූ ඇරිස්ටෝටල් දක්ෂ කාව්‍ය විචාරකයෙක් ද වෙයි.

(iv) ව්‍යක්ත ලේඛකයන් විසින් ඉංග්‍රීසි කෘතිහු සිංහලට පරිවර්තනය කරනු ලැබූහ.

(v) එම්බල පුරුෂය, සතෙක් මෙන් වැඩ නො කරන්න.

(ආ) පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවන්න.

(i) ගොවීහු මහ කන්නය සඳහා සුදුසු කෘෂි බීජ තෝරා ගනිති.

(ii) ඇමතිවරු 'කෝප්' සමිටු වාර්තාව අනුමත කරති.

(iii) විදුහල්පතිතුමා සාහිත්‍ය උත්සවයේ දී මා ඇගයුවේ ය.

(iv) විද්‍යා චක්‍රවර්තිහු බුත්සරණ රචනා කළහ.

(v) ඔවුහු එකී සම්මානය සඳහා දක්ෂ ලේඛිකාවක නම් කරති.

(ඉ) නිවැරදි වාක්‍යයක් නිර්මාණය කිරීම සඳහා සුදුසු පද වරහන් තුළින් තෝරා ලියන්න.

(i) කුඨ (ව්‍යාපාරිකයන්/ව්‍යාපාරිකයෝ) සීනි තොග (සඟවති/සඟවනු ලබති.)

(ii) (ශිෂ්‍යයෝ ද අපි ද/ශිෂ්‍යයන් ද අපි ද) ඒ උත්සවයට (යති/යමු.)

(iii) ආරාධිත (අමුත්තන්/අමුත්තෝ) සභා ගර්භයට පිවිස (ඇත/ඇත්තේ ය.)

(iv) (මිනිසුන්/මිනිස්සු) වසංගතයෙන් මිය යද්දී (නායකයෝ/නායකයන්) මුනිවත රකිති.

(v) (වියතුන්/වියත්තු) මෙන් කටයුතු කරන (පුද්ගලයෝ/පුද්ගලයන්) සමාජයට ආදර්ශ දෙති.

(ලකුණු 05 × 3 =15 යි.)



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**5.** පහත දැක්වෙන වාක්‍යවල **තද කළු අකුරෙන්** මුද්‍රිත පදවල ව්‍යාකරණ අංගය දක්වා ඇත. ඒවායෙහි **අනු-අංගය** දක්වන්න.

(i) ත්‍යාග **ප්‍රදානෝත්සවය** බණ්ඩාරනායක අනුස්මරණ **සම්මන්ත්‍රණ ශාලාවේ** දී පැවැත්වේ.
(**ප්‍රදානෝත්සවය** - සන්ධි, **සම්මන්ත්‍රණ** - උපසර්ග, **ශාලාවේ** - විභක්ති)

(ii) මුදු සුමුදු **සුසුදු** වත මුදු ව සිපගත් **පියාණෝ** සිය පුතුට **නිමල** සිතින් සමුදුන්හ.
(**සුසුදු** - උපසර්ග, **පියාණෝ** - තද්ධිත, **නිමල** - සමාස)

(iii) සමහර **තරුණතරුණියෝ සද්දිනක්** මඟුල් **කා** විවාහ උත්සව පවත්වති.
(**තරුණතරුණියෝ** - සමාස, **සද්දිනක්** - සන්ධි, **කා** - ක්‍රියා)

(iv) **වැව්ජලය** පිස **හමන මදසුළඟ** ජනයාගේ ගත දාහය නිවී ය.
(**වැව්ජලය** - සමාස, **හමන** - කෘදන්ත, **මදසුළඟ** - සමාස)

(v) **අනේ**! **මාගේ** වස්තුවට වූ මේ විපත දෙවියෝ ම **බලත්වා**!
(**අනේ** - නිපාත, **මාගේ** - විභක්ති, **බලත්වා** - ක්‍රියා) (ලකුණු 03 × 5 =15 යි.)

**6.** (අ) පහත දැක්වෙන වාක්‍යවල හිස් තැනට වඩාත් ම ගැළපෙන පදය වරහන තුළ දී ඇති පද අතුරෙන් තෝරා ලියන්න.

(i) සමහරු .......................... රටවල සංචාරයෙහි යෙදීමට බෙහෙවින් කැමති වෙති.

(ii) වර්තමාන .......................... ප්‍රජාව ගුණධර්මයන්ගෙන් හීන යැයි ඇතැම්හු චෝදනා කරති.

(iii) ඇ සිය .......................... යුග්මය අඤ්ජනයෙන් සරසා ගත්තා ය.

(iv) "සරසවි .......................... අයිතීන් දිනා ගැනීමට පෙළ ගැසෙමු" යි කැඳවුම්කරු පැවසී ය.

(v) යම් රටක් .......................... ආධිපත්‍යයට නතු වූ විට ඒ රටෙහි ස්වාධීනත්වය වියැකී යයි.

(vi) යොවුනඟනගේ .......................... කැලුම් වැද ප්‍රියයාගේ මුව පියුම විකසිත වී ය.

(ශිෂ්‍ය, විදෙස්, නේත්‍ර, විදේශ, සිසු, නෙත්) (ලකුණු $\frac{1}{2} \times 6 = 03$ යි.)

(ආ) පහත සඳහන් වාක්‍යය වර්තමාන ලේඛන ව්‍යවහාරයෙන් ලියන්න.

විස්ස විජ්ජාලේ ගිය සමහර අය කියන්නෙ කතා කරන බාසාවෙන් ලියනෙක හොඳ නැහෙයි කියල.
(ලකුණු $\frac{1}{2} \times 6 = 03$ යි.)

(ඉ) **තද කළු අකුරෙන්** මුද්‍රිත පදවල විභක්ති නම් කරන්න.

(i) **වනයෙන්** එළියට ආ මිනිසා මට **අතින්** සංඥා කළේ ය.

(ii) **ගමේ** සෑදෙන දේවල් ගුණදායක යැයි ඔහු **කඩෙන්** එළවලු නො ගෙනෙයි.

(iii) ගුණමකු **මිනිස**, නුඹ **නුඹගේ** ධනය පරලොව රැගෙන යව'යි නැණවතා කී ය.
(ලකුණු $\frac{1}{2} \times 6 = 03$ යි.)

(ඊ) අවශ්‍ය තැන්වල විරාම ලක්ෂණ යොදා පහත දැක්වෙන කොටස නැවත ලියන්න.

අහෝ අපගේ රටට වූ විනාශයක් මේ විපතින් මුළු මහත් රටවැසියා ම අනතුරක ය අවිනිශ්චිතතාවක ය උභතෝකෝටිකයක ය මින් මිදීමට අපට මාර්ගයක් නැත්තේ ම ද අසහාය නායකයාණනි අපගේ මේ දුෂ්කරතාව දෙස බලා අපට පිහිට වන සේක්වා (ලකුණු $\frac{1}{2} \times 6 = 03$ යි.)

(උ) පහත දැක්වෙන ප්‍රකාශවල එක් එක් ප්‍රකෘති කථනය විකෘති කථනයට හරවා ලියන්න.

(i) "මම මේ රටින් පිටව යමි" යි කමල් කීවේ ය.

(ii) "නිලධාරීන් ආයතනයෙන් පිට වී යද්දී කම්කරුවෝ කෑගසමින් සිටියහ" යි වාර්තාකරු පැවසී ය.

(iii) "මෙතැනින් බැහැරට යන්න" යි ගුරුතුමා ශිෂ්‍යයාට දැන්වී ය. (ලකුණු 01 × 3 = 03 යි.)



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**7.** පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

කෝකිලයන්ගේ **කූජනයෙන්** ද සිංහයන්ගේ ගර්ජනාවෙන් ද හස්තීන්ගේ **කුඤ්චනාදයෙන්** ද ඒ වනගැබ ඒකනින්නාද විය. හංසාංගනාවෝ නිල් ජල තලය මත ඔබිනොබ සරති. **මුවගණෝ** ළපලුපත් සිය මුවගෙහි රුවා ගනිති. ඔදවත්, තෙදවත්, බලවත් **හස්තිරාජයෙක්** වනය දෙවනත් කරමින් ඒ මේ අත දුවයි. මින් කම්පිත ව භීතියට පත් වූ කුළුමීමෝ හිස් ලූ ලූ අත දුවමින් ක්ෂණයෙන් අතුරුදන් වූහ. **ව්‍යාඝ්‍රයාගේ** සංචාරයෙන් හා රෞද්‍ර නාදයෙන් තැතිගත් මුව පොව්වෝ පසු නොබලා දිව ගොස් වන වදුලක සැඟ ව ගත්හ. **මයුරයෝ** කේකාධ්වනි පවත්වා මනෝරම්‍ය වූ **නර්තනයකින්** වනයේ අසිරිය දෙගුණ තෙගුණ කළහ. මේ කෝලාහලයෙන් භීතියට පත් ව ඇලළී ගිය හා පොව්වෝ වහවහා ගුල් තුළට වැදුණහ.

(i) **තද කළු** අකුරින් මුද්‍රිත වචන අකාරාදි පිළිවෙළින් පෙළ ගස්වා ලියන්න.

(ii) කෝකිල, අතුරුදන්, භීතියට යන වචනවල යෙදී ඇති පිළි වෙන වෙන ම ලියන්න.

(iii) අස්ත්‍යර්ථයේ තද්ධිත පද **තුනක්** මේ ඡේදයෙන් උපුටා දක්වන්න.

(iv) හංසාංගනාවෝ, ඔබිනොබ, මුවගෙහි යන වචන විසන්ධි කරන්න.

(v) මේ ඡේදයේ ඇතුළත් යංශයක් හා කණ්ඨජ ඝෝෂ මහාප්‍රාණයක් අන්තර්ගත වචනයක් උපුටා දක්වන්න.

(ලකුණු 03 × 5 =15 යි.)

**8.** පහත සඳහන් මාතෘකාවලින් **තුනක්** තෝරා ගෙන කෙටි සටහන් ලියන්න.

(i) දන්තජාක්ෂර

(ii) වර්තමාන කාල කෘදන්ත

(iii) ස්ත්‍රීලිංග නාම පද

(iv) මිශ්‍ර ක්‍රියා පද

(v) ආගම සන්ධිය

(ලකුණු 05 × 3 =15 යි.)

* * *

www.alevelapi.com

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .


www.AlevelApi.com

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2021 (2022)

# 71 - සිංහල

ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන/ සහකාර පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2021 (2022)

## 71 - සිංහල I

## ලකුණු බෙදී යාම

### I පත්‍රය

මේ ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න අටකින් සමන්විත ය. පළමු ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සැපයිය යුතු ය.

**පළමු ප්‍රශ්නය :-** මේ ප්‍රශ්නය (අ), (ආ), (ඉ), (ඊ), (උ), (ඌ), (එ) යනුවෙන් කොටස් හතකින් (07) සමන්විත ය.

- (අ), (ආ), (ඉ), (ඊ), (උ) අවබෝධය - ලකුණු 16 යි (4 x 4 = 16)

  (මේ කොටස් පහෙන් සතරකට (04) පමණක් පිළිතුරු සැපයිය යුතු ය.)

- (ඌ) අවස්ථා සම්බන්ධය - ලකුණු 12 යි (3 x 4 = 12)

  (i, ii, iii, iv,v, vi, vii මේ කොටස්වලින් අවස්ථා සතරකට (04) පමණක් පිළිතුරු සැපයිය යුතු ය.)

- (එ) රසාස්වාදය - ලකුණු 12 යි.

**ලකුණු 40යි.**

අංක 02 සිට 08 තෙක් ප්‍රශ්න නිර්දිෂ්ට ග්‍රන්ථ ඇසුරෙන් සකසා ඇත. ඒ අතුරින් සතරකට (04) පිළිතුරු සැපයිය යුතු වේ. එක් ප්‍රශ්නයකට 15 බැගින් ලකුණු 60කි. (3 වන ප්‍රශ්නය (අ), (ආ) යනුවෙන් කොටස් දෙකකි. (අ) කොටසට ලකුණු 07කි. (ආ) කොටසට ලකුණු 08කි.)

www.alevelapi.com

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

# උත්තර පත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තර පත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතු වේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තර පත්‍ර ලකුණු කිරීමට රතු පාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
2. සෑම උත්තර පත්‍රයක ම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ඉලක්කම් ලිවීමේ දී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.
3. ඉලක්කම් ලිවීමේ දී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලි ව තනි ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.
4. එක් එක් ප්‍රශ්නයේ අනුකොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

උදාහරණ : ප්‍රශ්න අංක 03

(i) ..................................................
.................................................. √ △ $\frac{4}{5}$
..................................................

(ii) ..................................................
.................................................. √ △ $\frac{3}{5}$
..................................................

(iii) ..................................................
.................................................. √ △ $\frac{3}{5}$
..................................................

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = □ $\frac{10}{15}$

**බහුවරණ උත්තර පත්‍ර : (කවුළු පත්‍රය)**

1. අ.පො.ස. (උ.පෙළ) හා තොරතුරු තාක්ෂණ විභාගය සඳහා කවුළු පත්‍ර දෙපාර්තමේන්තුව මගින් සකසනු ලැබේ. නිවැරදි වරණ කපා ඉවත් කළ සහතික කරන ලද කවුළුපතක් ඔබ වෙත සපයනු ලැබේ. සහතික කළ කවුළු පත්‍රයක් භාවිත කිරීම පරීක්ෂකගේ වගකීම වේ.
2. අනතුරුව උත්තර පත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.
3. කවුළු පත්‍රය උත්තර පත්‍රය මත නිවැරදි ව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද වැරදි පිළිතුර 0 ලකුණකින් ද වරණ මත ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තර පත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තර පත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතු වේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තර පත්‍රයේ සෑම උත්තරයකට ම දී ඇති ලකුණු ගණන උත්තර පත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළ දී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙන ම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රය සඳහා බහුවරණ පිළිතුරු පත්‍රයක් පමණක් ඇති විට ලකුණු ලැයිස්තුවට ලකුණු ඇතුළත් කිරීමෙන් පසු අකුරෙන් ලියන්න. අනෙකුත් උත්තර පත්‍ර සඳහා විස්තර ලකුණු ඇතුළත් කරන්න.

***

## අභිමතාර්ථ

**I පත්‍රය**

අ.පො.ස. (උ.පෙළ) විභාගයට පෙනී සිටින විද්‍යාර්ථීන් සතු ව පවතින:

- සම්භාව්‍ය සිංහල (නිර්දිෂ්ට) ගද්‍ය හා පද්‍ය කෘති කියවා අවබෝධ කර ගැනීමේ ශක්‍යතාව හඳුනා ගැනීම ද

- නූතන ගද්‍ය-පද්‍ය හා කාව්‍ය නිර්මාණ රස විඳීම හා තදනුබද්ධ විචාරාත්මක දෘෂ්ටිය කෙබඳු දැයි හඳුනා ගැනීම ද

- කාව්‍ය විචාර සංකල්ප හඳුනා ගෙන රස විඳීම හා විචාරය කිරීමේ ශක්‍යතාව මැන බැලීම ද මේ පත්‍රයෙන් අපේක්ෂිත ය.

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

www.AlevelApi.com



1. පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) හා (උ) උද්ධෘත අතුරෙන් **සතරක්** තෝරා ගෙන ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට ද (ඌ) හා (එ) ප්‍රශ්නවලට ද පිළිතුරු සපයන්න. (මේ ප්‍රශ්නයට පිළිතුරු ලිවීමේ දී වර්තමාන ලේඛන ව්‍යවහාරය ම යොදා ගන්න.)

(අ) සැවත් නුවර අදින්නපුබ්බක නම් බමුණාණකෙනෙක් වෙසෙති. ඌ තුමූ සුධාභොජන ජාතකයෙහි කෙළගණන් වස්තු ඇති සිටාණන් සක්දෙවිඳුගේ උපදෙසින් දන්දීමෙහි අදහස් ඇති වන තෙක් කිසි කෙනකුන්ට කිසිවක් දීලන්ට මැළියා සේ ඉල්ලීස සිටාණන් ඉල්ලීස සිටුවෙස් ගත් සක්දෙවිඳුහු සම්පත් විසුරුවා දන් දෙන තෙක් තමන් දීගත නුහුණු වූවා සේ බුදුන්ගෙන් බණ අසා නිවන් දැක මසුරුසිත් තුනී වන තෙක් තණ අග ගලා තෙල් බින්දුවක් විතරත් අනුන්ට නුදුන්විරු ය. එසේ හෙයින් 'අදින්නපුබ්බක'ය යන නම අර්ථාන්විත නම ය. උන්ගේ එක ම පුතණුකෙනෙක් ඇත. ජීවිතයක් සේ ඉතා ප්‍රියයෝ ය. ඒ ප්‍රිය පුතණුවන්ට ආභරණයක් කරවන්ට සිතා කෙළගණන් සම්පත් ඇති තැනැත්තෝ නුග ගස මහත් වත් නුග ඵලය කුඩා වන්නා සේ සම්පත් මහත් වූවත් අදහස කුඩා බැවින් ආභරණ කරවන්ට බඩාල් කෙනකුන් ගෙනාවොත් කර්මාන්ත කරවන තෙක් දවස් උන්ට බතුත් දියයුතු ය. එසේ කලට **නැතක් වී සාල්** වියදම් වෙයි.

(i) 'අදින්නපුබ්බක' යන නම අර්ථාන්විත වූයේ කවර හේතුවක් නිසා ද?

(ii) මහත් සම්පත් ඇතත් ඒවා වියදම් කිරීමට ඇති මැළිකම දැක්වීමට යොදා තිබෙන උපමාව කුමක් ද?

(iii) 'ආභරණ කරවන්ට බඩාල් කෙනකුන් ගෙනාවොත් ...' මෙය ලිහිල් බසින් ලියන්න.

(iv) '**නැතක් වී සාල්**' යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04 යි.)

පිළිතුරු:

(i) තෙල් බින්දුවක් තරම් දෙයක් වත් අනුන්ට නොදෙන අධික මාත්සර්යයෙන් / මසුරු බවින් / යුතු සිතක් ඇත්තකු වූ නිසා / ඉතා ස්වල්ප දෙයක් වත් කිසි ම අයකුට නොදුන් නිසා

(ii) නුග ගස මහත් වත් නුග ඵලය කුඩා වන්නා සේ

(iii) ආභරණ තැනවීමට කම්කරුවකු / කර්මාන්තකරුවකු කැඳවූවහොත්, ආභරණ සෑදීමට රන්රිදීකම් රත්‍රං රිදී කර්මාන්ත කරන්නකු රැගෙන ආවොත් / කැඳවාගෙන ආවොත් / ආභරණ නිෂ්පාදනය කරන්නකු රැගෙන ආවොත්

(iv) බොහෝ වී සහල්

(ලකුණු 1 × 4 = ලකුණු 04 යි.)

(ආ) එනුවර අසූකෙළක් ධන ඇති සිටාණන්ගේ සිටුදේවීන්ට ශීර්ෂාබාධයක් ඇතිව සත් අවුරුද්දක් මුළුල්ලෙහි මහත් වූ ව්‍යසන විය. දඹදිව බොහෝ වෛද්‍යාචාරීවරයෝ "අපි සන්සිඳුවම්හ, අපි සන්සිඳුවම්හ" යි වාසි කියකියා අවුත් නොයෙක් පිළියම් කොට සම්පත් ගෙන යන්නාහුය. ශීර්ෂාබාධය ඇසිල්ලකත් සන්සිඳුවාලිය නුහුණුවාහුය. ජීවකයෝ එපවත් අසා ඒ සිටාණන්ගේ සත්වැනි වාසලට ගොස් සිට වෛද්‍යයෙහි බලවත් ආචාරීකෙනෙක් වාසල සිටියෝයයි කියා යවූහ. සිටුදේවී එපවත් අසා ජීවකයන්ගේ වයස් විචාරා බාලදරුකෙනෙකැයි අසා සිනාසී "දඹදිව ප්‍රසිද්ධ ආචාරිවරහු අවුත් මා ඇසිල්ලකුත් නිඳවාපිය නුහුණුවහ. කිරි බොන තරම් බාලදරුකෙනෙක් කුමක් කෙරෙද්දැ"යි කියා "තමන් බඩ සා වුවහොත් බත් ලවාගෙන කන්ට කියව. අනික් කිසි අථාසුවෙක් ඇත් නම් ඉල්වාගෙන යන්ට කියව. නන් නොදොඩා ආ පස්සෙහි යන්ට කියව"යි කියා යවූහ.

(i) බොහෝ වෛද්‍යවරුන් කළ කාර්යය කුමක් ද?

(ii) සිටු දේවිය, බාල දරු කෙනකුන් ලෙස සැලකූ තැනැත්තා කවරෙක් ද?

(iii) 'මා ඇසිල්ලකුත් නිඳවාපිය නුහුණුවහ ...' මෙය ලිහිල් බසින් ලියන්න.

(iv) '**ශීර්ෂාබාධය**' යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04 යි.)

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**පිළිතුරු:**

(i)

1. තමන් රෝගය සනීප කරන බවට වහසි බස් කියමින් පැමිණ නොයෙක් ප්‍රතිකාර කොට වස්තුව රැගෙන යාම

- තමන්ට රෝගය සනීප කළ හැකි යයි පවසා නොයෙක් ප්‍රතිකාර කොට වස්තුව / සම්පත් රැගෙන යාම

(ii) ජීවක / ජීවකයෝ / ජීවක වෛද්‍යවරයා

(iii) මා ස්වල්ප මොහොතකට වත් නිඳි කරවීමට අසමත් වූවෝ ය /මා මඳ වේලාවක් වත් නිඳි කරවීමට අසමත් වූවෝ ය.

- මා ඇසිපිය ගසන තරම් කාලයක් වත් නිඳි කරවීමට සමත් නො වූවෝ ය.

(iv) හිසෙහි වේදනාව / ඔළුවේ කැක්කුම / හිසෙහි ඇති වූ අසනීපය / හිස රුදාව

(ලකුණු 1 × 4 - ලකුණු 04 යි.)

(ඉ) ගන්ධාර දේශයෙහි තක්සලා නුවර දිසාපාමොක් ආචාරීන් සමීපයට බ්‍රාහ්මණ කුමාරයෙක් ගොස් සියලු ශිල්ප ඉගෙන ඉනුත් ධනුශ්ශිල්පය නිමවා උගත, දිසාපාමොක් ආචාරී **සමාධී ව** බ්‍රාහ්මණ කුමාරයන්ට 'චූල්ල ධනුර්ධර' කුමාරයෝය යි නම් තබා තමන්ගේ වැඩිහිටි දුවණියන් පාවා දුන්හ. චූල්ලධනුද්ධරයෝ තමන්ගේ බිරින්ද කැඳවා ගෙන මාවතෙක යන්නාහු වනාන්තරයකට පැමිණියාහ, ඒ වනාන්තරයේ භයංකර වූ ත්‍රිමදගලිත හස්තියෙක් ඇත. ඒ හස්තියා ධනුද්ධරයන් දැක දිවගෙන ආය. චූල්ලධනුද්ධරයෝ පඤ්චායුධ සන්නද්ධ ව ඒ දඬු පන් සියයකුත් ඇරගෙන යන්නාහු හස්තියා දිවගෙන එන්නා ඒ දණ්ඩක් ඇද පියා ඇරගෙන විද්දාහු වාත කුම්බයෙන් විද පලවා ඇතා එතන ම එළා තික්මුණු කලට, අනික් වනාන්තරයක සොරුන් පන් සියයක් දඩ මස් පුළුස්සා කන කලට චූල්ලධනුද්ධරයෝ එතනට පැමිණ තමන් බිරින්දට කියන්නාහු "දඩ මස් පුළුස්සා කන මිනිසුන් උන් තෙනට ගොස් දඩ මස් ඉල්වා ගෙන එව"යි කියා යවූහ.

(i) බ්‍රාහ්මණ කුමාරයාට "ධනුර්ධර" යන නම තැබූයේ කවර හේතුවක් නිසා ද?

(ii) චූල්ලධනුද්ධරයන් තම බිරිඳ පන්සියයක් සොරුන් ඉදිරියට යැවූයේ කුමක් පිණිස ද?

(iii) "ඒ වනාන්තරයේ භයංකර වූ ත්‍රිමදගලිත හස්තියෙක් ඇත." මෙය ලිහිල් බසින් ලියන්න.

(iv) 'සමාධී ව' යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04 යි.)

**පිළිතුරු:**

(i) දුනු විදීමේ ශිල්පය /ධනුශ්ශිල්පය සම්පූර්ණයෙන් ප්‍රගුණ කොට තිබීම නිසා

- දුනු ශිල්පයෙහි සූරයකු නිසා / දුනු ශිල්පයෙහි කෙළ පැමිණියකු නිසා

(ii) දඩමස් ඉල්වා ගෙන ඒම පිණිස

(iii) එම කැලයේ ඉතා බියකරු වූ තුන් තැනකින් (දෙකන් හා ලිඟු) මද (ජලය) ගලන / මද වැගිරෙන ඇතෙක් ඇත / එම කැලයේ ඉතා බියකරු වූ තුන් තැනකින් මද (ජලය) / වැගුරුණා වූ ඇතෙක් ඇත.

(iv) සතුටට පත් ව / ප්‍රීතිමත් ව / සන්තෝෂයට පත් ව / සොම්නසට පත් ව

(ලකුණු 01 x 4 = 04 යි.)

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

(ජ) එකල්හි ඒ චණ්ඩාල බ්‍රාහ්මණයා "එසේය දේවයන් වහන්ස, මාගේ ස්වර්ණ තිලකා නම් වූ දූ තොමෝ ජාතිසම්පන්න කුලපුත්‍රයන් මිස සෙස්සවුන් නොකැමැත්තීය"යි කීය. එබස් අසා රජ්ජුරුවෝ "එම්බල සගය, එසේ වී නම් පඤ්චමධුරා නාම් නුවර උද්දාල නම් බමුණෙක් වෙසෙයි; ඒ බ්‍රාහ්මණයා ඉතා ජාති සම්පන්නය; මවුපිය දෙපක්ෂයෙන් ම **අනින්දිතය**, ස්ත්‍රීන් දුටු කල්හි මොහු ජුගුප්සා කටයුතු වූ ඉතා පිළිකුල් ජාතියෙකැ" යි නින්දා බැණ ඔවුන් හා සහවාසය නොකෙරෙයි; තමා වසන ගෙන් නික්ම රජගෙට යන එන වේලෙහි කිරිපැන් සොළොස් කළයක් මගදිග ඉස්වයි; ගැහැණුන් දුටු කල කාළකණ්ණියක දකපිම් යි කිරිපැනින් මුහුණ ශුද්ධ කෙරෙයි; එබැවින් තාගේ දූ සමර්ථ වූ නම් ඒ බමුණා හා සහවාසය කෙරේව යි මෙසේ මා කී ලෙස ම තාගේ දූවට කියා බලගැ" යි කීහ.

(i) උද්දාල බ්‍රාහ්මණයා ස්ත්‍රීන් දුටු කල මුහුණ දොවන්නේ මොනවායින් ද?

(ii) චණ්ඩාල බ්‍රාහ්මණයා තමන්ගේ දුව හඳුන්වා ඇත්තේ කවර ආකාරයකින් ද?

(iii) "කිරිපැන් සොළොස් කළයක් මග දිග ඉස්වයි." මෙය ලිහිල් බසින් ලියන්න.

(iv) '**අනින්දිතය**' යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04 යි.)

පිළිතුරු:

(i) කිරි ජලයෙන් / කිරි වතුරෙන් / කිරි දියරෙන් / කිරිවලින් / කිරිපැන්වලින්

(ii) ජාතියෙන් උසස් කුල පුත්‍රයන් මිස අන් අයට අකමැති තැනැත්තියක ලෙස

(iii) කිරි ජලය / කිරි කළ දහසයක් මාර්ගය දිගට ඉස්වයි.

(iv) නින්දාවිට පාත්‍ර නො වූයේ ය / නින්දාවට පත් නො වූයේ ය / නින්දා නො ලැබූවේ ය

**(ලකුණු 1 × 4 - ලකුණු 04 යි.)**

(උ) පිරි සිලිලෙන් පෙනෙ න
මහඋර මහත් සැපති න
එපුර ගිලෙනෙයි දැ න
බඹා ලූ තර වළල්ලක් මෙ න

පිරි සියපත් රෝන ට
පුරෙහි වත් සුණු සුවඳ ට
හැසිරෙන බමර ව ට
හෙළූ මිණිදැල් වැන්න අරක ට

(i) පළමු වන පද්‍යයෙන් වර්ණනයට ලක් වූ නගරාංගය කුමක් ද?

(ii) දෙ වන පද්‍යයෙන් දැක්වෙන උපමාව හා උපමේය වෙන් කොට දක්වන්න.

(iii) "පිරි සිලිලෙන් පෙනෙන මහඋර" මෙය ලිහිල් බසින් ලියන්න.

(iv) "**අරකට**" යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04 යි.)

පිළිතුරු:

(i) ප්‍රාකාරය / පවුර

(ii) උපමාව - මාණික්‍ය ජාල / මැණික් දැල් / මිණිගෙඩි / කිංකිණි ජාලා

උපමේය - භෘංග සමූහය / ඉගිලෙන (හැසිරෙන) බඹර සමූහය

(iii) දිය අගලෙහි දියෙන් / ජලයෙන් පෙනෙන / දිස්වෙන මහා ප්‍රාකාරය / මහ පවුර

(iv) ආරක්ෂාවට

**(ලකුණු 1 × 4 = ලකුණු 04 යි)**

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

- (ඌ) සහ (එ) ප්‍රශ්න දෙකට ම පිළිතුරු සපයන්න.

(ඌ) පහත සඳහන් උද්ධෘත අතුරෙන් හතරක අවස්ථා සම්බන්ධය දක්වන්න.

(i) "මා අවසර නැත. අනික් වෙදකෙනකුන් ගෙන්වා පිළියම් කරවනබව ය."

(ii) "මාගේ බුදුන්ට මතු පිළියම් කරන වෙදහුට මම ආචාරි වෙමි."

(iii) "මෙතැන්හි නො වසව, පර්වතයෙන් බැස මිනිසුන්ට විසය තැන නොවෙසෙත්ව."

(iv) "සියලු දිගන්තරය අන්ධකාර වූවාක් මෙන් චලිත ව වැටහෙයි; දැන් මට පිළිසරණ ව සංග්‍රහකරව."

(v) "ඒක වෙන ම කතාවක් නෙ? ඔය කුණු ගොඩ අත්හැර දාලා කසාදයක් බඳින්ඩ උඹට හොඳ කාලෙ දැන්"

(vi) "වැදගත් හැම සිදුවීමක් ම මේ පොතේ ලියන්න ඕන තේරුණාද?"

(vii) "කව් නළු රස බ්‍රහ්මාස්වාදයට සරිය." (ලකුණු $03 \times 4 = 12$ යි.)

**ලකුණු දීමේ නිර්ණායක**

**කතුවරයා , කෘතිය , කථා වස්තුව / කතාව සඳහා ලකුණු 01 යි**
**කා විසින් කාට කියන ලද ද ලකුණු 01 යි**
**අවස්ථාවට ලකුණු 01 යි**

**පිළිතුරු:**

(i) ධර්මසේන හිමියන් විසින් රචනා කරන ලද සද්ධර්මරත්නාවලියේ එන මට්ටකුණ්ඩලී වස්තුවෙන් උපුටා ගත් පාඨයකි. අදින්නපුබ්බක බමුණා විසින් අසාධ්‍ය ව සිටි තම පුතුට වෙදකම් කරවීමට කැඳවන ලද සැවැත් නුවර වෙදකු රෝගය පරීක්ෂා කොට සුවපත් කළ නොහැකි බව දැන ඔහුට (මට්ටකුණ්ඩලීගේ පියාට) කරන ලද ප්‍රකාශයකි.

(ii) මයුරපාද පරිවේණාධිපති බුද්ධ පුත්‍ර හිමියන් විසින් රචනා කරන ලද පූජාවලියෙන් උපුටා ගත් පාඨයකි. දිසාපාමොක් ඇදුරුතුමන් ජීවකට ශුභ මොහොතින් ශිල්ප ඉගැන්වීමට ආරම්භ කළ විට ශක්‍රයාගේ භවනය කම්පිත විය. එම අවස්ථාවේ ශක්‍ර දෙවියන්ට ඇති වූ සිතුවිල්ලකි.

(iii) පන්සිය පනස් ජාතක පොතෙහි එන චන්ද කින්නර ජාතකයෙන් උපුටා ගන්නා ලද්දකි. කිඳුරාගේ සුවපත් වීමෙන් සොම්නසට පැමිණි කිඳුරිය බමුණු වෙසක් ගෙන පැමිණි ශක්‍රයාගේ දෙපාමුල වැඳ වැටී වන්දනා කරන අවස්ථාවේ ශක්‍රයා විසින් කිඳුරියට කරන ලද ප්‍රකාශයකි.

(iv) II වන ධර්ම කීර්ති හිමියන් විසින් රචිත සද්ධර්මාලංකාරයේ ස්වර්ණතිලකා වස්තුවෙන් උපුටා ගන්නා ලද්දකි. ස්වර්ණතිලකා දැකීමෙන් බලවත් සේ චිත්ත වික්ෂෝභයට (සිතෙහි කැලඹීමට) පැමිණි උද්දාල බමුණා මිත්‍ර ජනයා (යාළු මිත්‍රයන්) අමතා කළ ප්‍රකාශයකි.

(v) ලෙනාර්ඩ් වුල්ෆ් විසින් රචිත ඒ. පී. ගුණරත්න විසින් පරිවර්තිත බැද්දේගම නවකතාවෙන් උපුටා ගත් පාඨයකි. තම බිරිඳ පුංචි මැණිකා ප්‍රනාන්දු මුදලාලිට කැමති නැති බව පැවසූ බබුන්ට බබේහාමි ආරච්චිල විසින් කරන ලද ප්‍රකාශයකි.

(vi) ජයතිලක කම්මැල්ලවීර විසින් ලියන ලද කළු සපත්තු කෙටිකතාවෙන් උපුටා ගත් පාඨයකි. සිරිදාසට බංගලාවක ආරක්ෂක භටයකු ලෙස සේවාව කිරීමේ අවස්ථාව ලැබුණු පසු ලැලි කුඩුවේ සිටි ආරක්ෂක භටයා සේවාවෙන් මුදා හළ ඩිරෙක්ටර් විසින්, සටහන් පොතක් සිරිදාසට දී මෙලෙස ප්‍රකාශ කරන ලදි.

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත

(vii) මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර විසින් රචිත "පෙමතො ජායතී සොකො" නාට්‍යයේ එන උද්දාල බමුණා තම යොවුන් සමය අර්ථ විරහිත ව ගෙවී ගොස් ඇති බව පැවසූ විට ස්වර්ණතිලකා ඔහු අමතා කළ ප්‍රකාශයකි.

(එ) පද්‍ය නිර්මාණයක සාර්ථකත්වය උදෙසා කාව්‍ය අන්තර්ගතය හා භාෂා භාවිතය ඉවහල් වන ආකාරය අවධානයට ගෙන පහත දැක්වෙන කාව්‍ය නිර්මාණය පිළිබඳ රසාස්වාදයක් කරන්න.

**රන් තැටියක කඳුළු**

මා පමණි ඔබ කැටුව ආවේ
මම ද යමි දියණියනි
මොහොතකින් සඳ ඒවි තනියට
රන් තැටිය පුරවා කඳුළින්

මෙතෙක් ලොව නො ඇසුව
මියුරු නැළවිලි ගී
ළයට කැටි කොට නිදයි ඔබෙ මව
අවදිවන ඇසිපියෙන්
බිඳී සුන් වන ලොවක.
බිහි නොවූ හෙට දවස
ඇය නොදත් රහස දැන
කාලයේ ගැබ තුළෙහි
ඉකි බිඳියි කම්පාව.

දස එකඩ මසක් ඈ රැකි
සෙනෙහසේ නිධානය
වෙස් මුහුණු තුළට වූ බහිරවයින්
තුහුරු බස් තෙපළමින්
වට වෙමින් අඳුරු තියෙන්
පැහැර සඟවන අතර,
බලා සිටියෙමි කොනක
ගොළු වෙමින් අසරණව.

සෙමෙන් තව තව සෙමෙන්
පස් පිඩැලි පෙරළන්න
මවගෙ ඇකයෙහි පහස
නො දත් දැරියකි සිහිනී.

කිරි ගරුඬ කොත් හෙළන
අඳුරු සෙවණැලි අතර
නුහුරු නුපුරුදු ලොවක
සැතපෙන්න දියණියනි.

මොහොතකින් සඳ ඒවි තනියට
රන් තැටිය පුරවා කඳුළින්.

(ලකුණු 12 යි.)

මෙම පද්‍ය නිර්මාණයට වස්තු විෂයය වන්නේ තම බිලිඳු දියණියන් උපතේ දී ම මිය යාම පිළිබඳ ව පියකු තුළ ඇති වන කම්පනය යි. එම භාවමය අද්දැකීමට පාඨකයා ද සහභාගි කරවා ගත හැකි ආකාරයෙන් අන්තර්ගතය ගොඩනඟන්නට කවියා සමත් වේ. බිලිඳියගේ අකල් මරණය පිළිබඳ ව නොදන්නා මව සුවදායක නින්දකට වැටී හිඳී. ඒ අවස්ථාවේ දී දියණියන්ගේ සිරුර සොහොන් බිමට ගෙන ගොස් මිහිදන් කරන පියාගේ භාව කම්පනය සංයමයෙන් හා කාව්‍යමය ගුණයෙන් අනූන ව ප්‍රතිනිර්මාණය කරන්නට කවියා සමත් වෙයි.

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

ඒ සඳහා කවියට අත්‍යන්තයෙන් ම උපකාරී වී ඇත්තේ අද්දැකීමට උචිත වන සේ සකසා ගත් භාෂා ව්‍යවහාරය යි. මෙම පද්‍ය නිර්මාණයේ භාෂා භාවිතය තුළ අන්තර්ගත විශේෂතා කිහිපයක් දක්නට ලැබේ. ඒවා මෙසේ ය,

**ධ්වනිතාර්ථවත් කාව්‍යෝක්ති භාවිතය**

"මෙතෙක් ලොව නො ඇසුව
මියුරු නැළවිලි ගී
ළයට කැටි කොට නිඳයි ඔබෙ මව
අවදිවන ඇසිපියෙන්
බිඳී සුන් වන ලොවක.

"කිරි ගරුඬ කොත් හෙළනා
අඳුරු සෙවණැලි අතර...

- **රූපකාර්ථවත් බස්වහරක් උපයෝගී කර ගැනීම**

"බිහි නොවූ හෙට දවස
ඇය නොදත් රහස දැන
කාලයේ ගැබ තුළෙහි
ඉකි බිඳියි කම්පාව."

"වට වෙමින් අඬු තියෙන්
පැහැර සඟවන අතර,"

- **භාවාත්මක ස්වරූපය**

"සෙමෙන් තව තව සෙමෙන්
පස් පිඩැලි පෙරළන්න
මවගේ ඇකයෙහි පහස
නො දත් දැරියකි සිඟිති."

"මම ද යමි දියණියනි
මොහොතකින් සඳ ඒවි තනියට"

www.alevelapi.com

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

- **පැරණි කාව්‍ය සංකල්ප ප්‍රතිවිරුද්ධ අර්ථයකින් යෙදීම**

  "මොහොතකින් සඳ ඒවි තනියට
  
  රන් තැටිය පුරවා කඳුළින්"

  මෙවැනි කරුණු සමඟ සංකල්ප රූප භාවිතය, නිදහස් ආකෘතිය ඇතුළු කාව්‍යමය උපක්‍රම කෙරෙහි අවධානය යොමු කරමින් රසාස්වාදය ලිවීම අපේක්ෂා කෙරේ.

**2. මනුෂ්‍යයන්ගේ චින්තන ක්‍රමය සහ ඊට අනුගත ව ක්‍රියාත්මක වන හැසිරීම් රටාව පිළිබඳ ව ධර්මසේන හිමියන් සතු ව පැවති විඥානය සද්ධර්මරත්නාවලියේ කථා වස්තු අර්ථවත් වීමට හේතු වී තිබේ දැයි නිර්දිෂ්ට කථා ඇසුරෙන් විමසන්න.**

මෙහි දී සද්ධර්මරත්නාවලියේ නිර්දිෂ්ට කථාවන්හි ප්‍රධාන චරිතවල ස්වභාවය හා ඊට අනුගත හැසිරීම් රටා පිළිබඳ කතුවරයා සතු ව පැවති විඥානය හෙවත් දැනීම පැහැදිලි කොට තිබිය යුතු අතර ඒ මඟින් කථාව පාඨකයාට ප්‍රයෝජනවත් වන ආකාරය ද දක්වා තිබිය යුතු ය. මේ සඳහා පහත කරුණු අවධානයට ගැනීම ප්‍රයෝජනවත් ය.

**මට්ටකුණ්ඩලී කථා වස්තුව**

- මට්ටකුණ්ඩලී කථා වස්තුවට අනුව ලෝභී පුද්ගලයකුගේ චින්තන ක්‍රමය සහ හැසිරීම් රටාව පිළිබඳ තොරතුරු ඇතුළත් වී තිබේ.
- දරුවකුගේ අවශ්‍යතා පිළිබඳ නිසි ලෙස අවධානය යොමු නොකිරීම
- දරුවකුගේ ජීවිතයට වඩා ධනය අගය කිරීම
- තමාගේ ලෝභකම නිසා යම් අපකීර්තියක් වේ නම් එයින් මඟ හැරීමට උපක්‍රම යෙදීම
- බුදුන්වහන්සේ දැක සිත පහදවා ගත් පමණින් දිව්‍ය සම්පත් ලද හැකි ද යන සැකය නිරාකරණය කර ගැනීම සඳහා බුදුන් උදෙසා දානයක් පිළියෙල කිරීම

මෙහි දී දැඩි ලෝභකමකින් යුක්ත පුද්ගලයකුගේ චින්තන ක්‍රමයත් හැසිරීම් රටාවත් පෙන්වා දීම ඔස්සේ ප්‍රකට වන්නේ මනුෂ්‍යත්වය පිළිබඳ ධර්මසේන හිමියන් සතු ව පැවති විඥානය යි. එය කථා වස්තුව අර්ථවත්වීමට ඉවහල් වී තිබේ.

**කුණ්ඩලකේසී කථා වස්තුව**

- සරාගික චින්තනයක ස්වභාවය සහ ඊට අනුගත හැසිරීම් රටාව නිරූපණය කිරීම
- ආදරය හමුවේ ස්ත්‍රියක සිදු කරන කැපකිරීම් යථා ස්වරූපයෙන් ඉදිරිපත් කිරීම
- ජීවිත තර්ජනයක් ඇති අවස්ථාවක පුද්ගලයකුගේ සිතුවිලි හා හැසිරීම් රටාවේ යථා ස්වභාවය විවරණය කිරීම
- ජීවිතාවබෝධය ඇසුරෙන් චිත්ත පාරිශුද්ධිය ලබා ගැනීමට ප්‍රයත්න දැරීම
  මේ ආදි කරුණු කුණ්ඩලකේසියගේ චරිතය ඇසුරෙන් ද
- චෞර ක්‍රියාවල නියුක්ත පුද්ගලයකුගේ චින්තන ක්‍රමය හා ඔහුගේ ගුප්ත හැසිරීම් රටාව සොරාගේ චරිතයෙන් ද පැහැදිලි කොට දී තිබේ.

මෙවැනි සිදුවීම් හා අවස්ථා තෝරා ගනිමින් උචිත නිදසුන් පාඨ සහිත ව නියමිත කථා වස්තු දෙක ඇසුරෙන් පිළිතුරු ලියා තිබීම අපේක්ෂා කෙරේ.
**(සමස්තයක් සේ සලකා ලකුණු ලබා දෙන්න.)**

**(ලකුණු 15 යි.)**

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

නැත හොත්

"කථා ශරීරයට ප්‍රමුඛ ස්ථානය ලබා දීමත් වර්ණනීය අවස්ථා සංක්ෂිප්ත ලෙස දැක්වීමත් ජාතක කථා රචනා රීතියේ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණයකි." නිර්දිෂ්ට ජාතක කථා ආශ්‍රයෙන් විමසන්න. (ලකුණු 15 යි.)

මෙහි දී ජාතක කතාවල ආකෘතියට ඇතුළත් වර්තමාන කථාව, අතීත කථාව, චරිත සමෝධානය යන අංග කෙරෙහි අවධානය යොමු කරමින්, වර්ණනීය අවස්ථා සංක්ෂිප්ත ලෙස දැක්වීම ජාතක කථා රචනා රීතියේ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණයක් බව පැහැදිලි කරමින් පිළිතුරු ලියා තිබීම අපේක්ෂිත ය.

**චුල්ලධනුද්ධර ජාතකය**

- චුල්ලධනුද්ධර ජාතකයේ බ්‍රාහ්මණ කුමරා ශිල්ප හැදෑරීම, සරණ මංගල්‍යය, වනගත ගමන, ඇතා සහ සොරුන් මරා දැමීම, කුමරා සහ සොර දෙටුවා අතර සටන, කුමරිය සොර දෙටුවා සමඟ යෑම, සොරා ආභරණ ගෙන පලා යාම, කුමරිය වනයේ තනිවීම, ශක්‍රයා ඉදිරිපත් වී වරද පැහැදිලි කර දීම, ඇයට අවවාද දීම

ආදි සිදුවීම් ජාතක කථා ආකෘතියට අනුගත ව ඉදිරිපත් කර තිබේ.

- සරණ මංගල්‍යය, වනාන්තර ගමන ද්වන්ද්ව සටන, අසරණ වූ කුමරියගේ විලාපය වර්ණනා කිරීමට අවස්ථාව තිබුණත් ඒවා මගහැර කථා වස්තුවට මුල් තැන දී මෙම ජාතක කථා නිමවා තිබේ.

**චන්දකින්නර ජාතකය**

- චන්දකින්නර ජාතකයේ වර්තමාන කථාවෙහි එන බුදුන් වහන්සේ කිඹුල්වත් නුවරට වැඩම කරවීම සහ යශෝධරා දේවියගේ මාලිගයේ දී ඇය හමුවන අවස්ථාව
- ~~වර්තමාන~~ අතීත කථාවේ දී චන්දකින්නර ජාතකයේ සඳකිඳුරා සහ කිඳුරිය කෙළිදෙළෙන් සිටින අවස්ථා, හී පහරට ලක් වූ සඳකිඳුරාගේ වේදනාව, කිඳුරිය බරණැස් රජුට චෝදනා නැඟීම, කිඳුරිය සඳකිඳුරාගේ මළ සිරුර ඉදිරියේ හඬාවැලපීම ආදි සිදුවීම් ජාතක කථා ආකෘතියට අනුගත ව ඉදිරිපත් කර තිබේ.
- මෙහි දී ඇතැම් අවස්ථා දීර්ඝ වර්ණනයට ලක් කළ හොත් කථා වස්තුවට යොමු වන අවධානය අඩු වන නිසා ඒවා සංක්ෂිප්ත ලෙස වර්ණනයට ලක් කොට ඇති ආකාරය දැක ගත හැකි ය.

අදාළ ජාතක කථා දෙකෙන් උක්ත කරුණු නියෝජනය වන සේ උචිත නිදසුන් පාඨ යොදා ගනිමින් පිළිතුරු ලියා තිබීම අපේක්ෂිත ය.

**(සමස්තයක් සේ සලකා ලකුණු ලබා දෙන්න.)**

(ලකුණු 15 යි)

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**3.** පහත (අ) කොටසේ ප්‍රශ්නය සහ (ආ) කොටසින් තවත් එක් ප්‍රශ්නයක් ද තෝරා ගෙන පිළිතුරු සපයන්න.

(අ) "දඹදෙණි, ගම්පළ අවධිවල ද මෙරට ගද්‍ය කාව්‍ය රචකයෝ ජනකාන්ත ධර්ම දේශනා රීතියෙන් බැහැර නො වූහ." උදාහරණ සහිත ව පරීක්ෂා කරන්න. (ලකුණු 07 යි.)

මෙම ප්‍රශ්නයෙහි (අ) කොටස අනිවාර්ය වේ. (ආ) කොටසෙහි අන්තර්ගත ප්‍රශ්න දෙකෙන් එකක් තෝරා ගත යුතු ය.

(අ) දඹදෙණි සහ ගම්පළ අවධිවලද දී ද මෙරට ගද්‍ය කාව්‍ය රචකයන් ජනයා ආකර්ෂණය කර ගන්නා ආකාරයෙන් ධර්මදේශනා රීතියෙන් බැහැර නොවී කෘති සම්පාදනය කළ බව උදාහරණ සහිත ව මෙම කොටසින් පැහැදිලි කර තිබිය යුතු ය.

**දඹදෙණි අවධියේ රචිත ගද්‍ය කෘති**

සද්ධර්මරත්නාවලිය - ධර්මසේන හිමි

පූජාවලිය - මයූරපාද පරිවේණාධිපති බුද්ධ පුත්‍ර හිමි

**ගම්පළ අවධියේ රචිත ගද්‍ය කෘති**

එළු අත්තනගලු වංශය - කර්තෘ අඥාත යි

නිකාය සංග්‍රහය - දෙවන ධර්මකීර්ති හිමි

සද්ධර්මාලංකාරය - දෙවන ධර්මකීර්ති හිමි

**දඹදෙණි හා ගම්පළ අවධිවල සාහිත්‍ය කෘතිවල අන්තර්ගත ජනකාන්ත ධර්ම දේශනා රීතිමය ලක්ෂණ**

- දීර්ඝ රචනා ශෛලිය භාවිතය
- විශේෂණ පද බහුල භාෂා ශෛලිය
- උපමා බහුල ව භාවිත කිරීම
- නාටෝචිත ආකාරයෙන් වර්ණනා භාවිත කිරීම
- සාමාන්‍ය ජනයාට වැටහෙන පරිදි සරල බස් වහරක් භාවිත කිරීම
- තත්සම පද බහුල වර්ණනාත්මක ශෛලියක් භාවිත කිරීම

දඹදෙණි - ගම්පළ අවධිවල ද මෙරට ගද්‍ය කාව්‍ය රචකයන් ධර්ම දේශනා රීතියෙන් බැහැර නො වූ බව ඉහත දැක්වූ කරුණු උපයෝගී කොට ගෙන කෘති දෙකක් ඇසුරින් පැහැදිලි කර තිබිය යුතු ය.

**(ලකුණු 07 යි.)**

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

(ආ) සද්ධර්මාලංකාර කතුවරයා කාමයෙහි ආදීනව ප්‍රකට කිරීම සඳහා කාම් සංකල්පවලින් විසිතුරු වූ රසවත් සිද්ධි ඇතුළත් කථාන්තර උපයෝගී කොට ගෙන ඇති ආකාරය නියමිත කථා වස්තු ඇසුරෙන් පැහැදිලි කරන්න.

(ආ) සද්ධර්මාලංකාර කතුවරයා කාමයේ ආදීනව ප්‍රකට කිරීම සඳහා කාමී සංකල්පවලින් විසිතුරු වූ රසවත් සිද්ධි ඇතුළත් කතාන්දර නිර්මාණය කර තිබෙන ආකාරය කථා වස්තු ඇසුරෙන් පැහැදිලි කිරීම මෙහි දී අපේක්ෂිත ය.

**ස්වර්ණතිලකා වස්තුව**

මෙහි දී ස්වරණතිලකා සිය රූපය පිළිබඳ අභිමානයෙන් කටයුතු කිරීම සහ වංශවතුන් අබිමුවෙහි සරාගී ලෙස හැසිරෙමින් ඔවුන් මුළා කිරීමට පෙලඹීමත් එහි ප්‍රතිඵලයක් ලෙස එම වංශවතුන් මෙන් ම ඇය ද ඛේදනීය ජීවිත ඉරණමකට ගොදුරු වීමත් රසවත් සිද්ධි මඟින් දක්වා තිබෙන අතර එයින් පිළිබිඹු වන්නේ කාමයේ ආදීනව යි.

- උද්දාල බමුණා හමුවට යන අතරතුර දී ස්වර්ණතිලකාට මුණගැසෙන රජවරුන් පිළිබඳ සිදුවීම්
- උද්දාල බමුණා මුණගැසෙන පළමු අවස්ථාවේ දී ස්වර්ණතිලකාගේ ක්‍රියාකලාපය සහ බමුණාගේ ප්‍රතිචාර
- එමෙන් ම කාමයේ ආදීනව දැක්වීම සඳහා මෙසේ මුළාවට පත් ව කටයුතු කරන සියලු දෙනා අභාග්‍යසම්පන්න ජීවිත ඉරණමකට මුහුණ දෙන අකාරය
- ස්වර්ණතිලකා ද තම අරමුණෙහි ම ගොදුරක් ව විනාශයට පත් වීම

**නන්දිවාණිජ වස්තුව**

අන්සතු ස්ත්‍රියක කෙරෙහි අනුරාගී හැඟීමෙන් කටයුතු කරමින් ඇය ලබා ගැනීමට යොදන උපක්‍රම මඟින් පුද්ගලයා විනාශයට පත්වන ආකාරය මෙම කථාවෙන් නිරූපිත ය.

- සිව ඇමති නන්දිය වෙළඳ භාර්යාවගේ රූපශ්‍රීයෙන් උමතු ව හැසිරෙන ආකාරය සහ ඇය දිනා ගැනීමට උත්සාහ ගැනීම
- අමනුෂ්‍ය ආත්මයක් සහාය කොට ගෙන නන්දිය වෙළෙන්දා මරණයට පත් කිරීමට උපක්‍රම යෙදීම
- එහි ආදීනව ලෙස අමාත්‍යවරයා ද මරණයට පත් වීම

නිර්දිෂ්ට කථා වස්තු දෙකට අදාළ ඉහත දැක්වෙන කරුණු නියෝජනය වන සේ නිදසුන් සහිත ව පිළිතුරු සපයා තිබීම අපේක්ෂිත ය.

**(ලකුණු 08 යි.)**

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

නැත හොත්

"කුශලාකුශල කර්ම ඵල විපාක, සිත් ඇද ගන්නා ලෙස යොදා ගැනීම නිසා පූජාවලිය ජනප්‍රිය භක්ති කාව්‍යයක් වී තිබේ." නිර්දිෂ්ට කථා වස්තුවලින් ගත් නිදසුන් ඇසුරෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 08 යි.)

කුශලාකුශල කර්ම ඵල විපාක සිත් ඇද ගන්නා ලෙස යොදා ගැනීම නිසා පූජාවලිය ජනප්‍රිය භක්ති කාව්‍යයක් වී තිබේ. මෙහි දී පූජාවලී කතුවරයා ජනතාවට කුශලාකුශල කර්ම ඵල විපාක පිළිබඳ අවබෝධයක් ලබා දීමට උත්සාහයක් දරයි. ඒ සඳහා කිසියම් කථා වස්තුවක් දක්වන අතරතුර මිනිසා විසින් සිදු කරනු ලබන කුශලාකුශල කර්මවල ප්‍රතිඵල පෙරළා ඔහුට ම ලැබෙන ආකාරය ද පැහැදිලි කර දෙයි. පූජාවලිය ජනප්‍රිය වීමට ඒ කරුණ හේතු වී ඇති බව මේ පිළිතුරෙන් ප්‍රකාශ විය යුතු ය.

අනුරුද්ධ කුමාර කථාව

- මහා පින් ඇති අයකු නිසා "නැතැයි" යන වචනය පවා නොදැනීම
- දේවතාවා සුවඳ කැවුම්වලින් පාත්‍රය පිරවීම
- බැළ මෙහෙවර කොට ලබා ගත් බත්, පසේ බුදුන්ට පූජා කිරීම නිසා දිළිඳු කුලයක නො
- ඉපදී රාජ කුලයක ඉපදීම
- පියුමතුරා බුදුන් වහන්සේගේ කාලයෙහි පහන් පූජාවක් පැවැත්වීම නිසා දිවැස් ලැබීම
- ලෞකික වශයෙන් උත්තරීතර තත්ත්වයට පත්වූවන් මෙන් ම, ශක්‍ර, බ්‍රහ්ම ආදීන් පවා අකුසල කර්ම හේතුවෙන් සතර අපායවල හා ප්‍රේත ලෝකවල ඉපිද දුක් විඳින බව දක්වා තිබීම

ජීවක වෛද්‍යවරයාගේ කථාව

- කසල ගොඩට දැමූ දරුවා පින් බලය නිසා සතුන්ගෙන් බේරීම
- පින් බලයෙන් ඒ ආත්මයේ දී ම සෝවාන් වන බව දැන ගැනීම
- බුදුන් වහන්සේට පිළියම් කරන්නට කල්ප ලක්ෂයක් පාරමිතා පුරා පැමිණීම
- පුණ්‍යවන්තභාවය නිසා ශක්‍ර දේවේන්ද්‍රයා ජීවක කුමාරයාට වෛද්‍ය ශාස්ත්‍රය ඉගැන්වීම
- ආචාර්යවරයා පවා නොදන්නා දිව්‍යමය ඖෂධ කුමාරයා දැන සිටීම
- සොළොස් අවුරුද්දකින් ඉගෙන ගත යුතු ශාස්ත්‍රය සත් අවුරුද්දෙන් ඉගෙන නිමවීම

ආදි වශයෙන් කුශල කර්මවල ආනිසංස ද මෙහි සිත් ඇඳගන්නා ලෙස විස්තර කොට ඇති නිසා පූජාවලිය ජනප්‍රිය භක්ති කාව්‍යයක් වී තිබේ.

නිර්දිෂ්ට කථා වස්තු දෙකට අදාළ ඉහත දැක්වෙන කරුණු නියෝජනය වන සේ නිදසුන් සහිත ව පිළිතුරු සපයා තිබීම අපේක්ෂිත ය.

(ලකුණු 08 යි.)

www.alevelapi.com

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

www.AlevelApi.com



**4.** "වෑත්තෑවේ හිමියන් ගුත්තිල කාව්‍යය සඳහා වස්තු විෂය කර ගත්තේ අතීත කථා ප්‍රවෘත්තියක් වුව ද වර්තමාන පාඨකයාට ද කාල භේදයකින් තොර ව එයින් රසාස්වාදයක් ලබා ගත හැකි ය." විමර්ශනයට ලක් කරන්න.
(ලකුණු 15 යි.)

ගුත්තිල කාව්‍යය නිර්මාණය වී ඇත්තේ ගුත්තිල ජාතකය ඇසුරෙනි. එබැවින් එහි ඇත්තේ පැරණි කථා ප්‍රවෘත්තියකි. එහෙත් කාලභේදයකින් තොර ව වර්තමාන පාඨකයාට ද එයින් රසාස්වාදයක් ලැබිය හැකි බව නිදසුන් ඇසුරෙන් පෙන්වා දීම පිළිතුරෙන් අපේක්ෂා කෙරේ.

පිළිතුර ලිවීමේ දී පහත දැක්වෙන කරුණු ඇසුරු කර ගැනීම යෝග්‍ය වේ.

➢ **චරිත නිරූපණය**

ගුත්තිල කාව්‍යයේ ගුත්තිල මූසිල යන ප්‍රධාන චරිත දෙක නිරූපණය වී ඇත්තේ සංකීර්ණ මානුෂීය සම්බන්ධතා අන්තර්ගත වන පරිදි ය. එය වර්තමාන පාඨකයාගේ රසවින්දනයට ඉවහල් වේ.

උදා :

"එකල ඒ ගඟ ඔා
දක්වා සිල්ප නොත බා
වෙළඳ දන පොල ඔා
ගනිමි යන සිතිනි දන නොත බා"

"නිසි සිප් නොදත්ත හු
දුරු රට සිට පැමිණිය හු"
.......................................................

**අවස්ථා නිරූපණය**

පැරණි කතාවේ (ගුත්තිල ජාතකයේ) ඇතුළත් නොවන රසවත් අවස්ථා ද ගුත්තිල කාව්‍යයේ අන්තර්ගත ව ඇත. උදේනිපුර සැණකෙළිය, මූසිල වෙළෙඳුන් ඉදිරියේ වීණාව වාදනය කරන ආකාරය, ගුත්තිල මූසිල වීණා වාදනය දිගන්තය පුරා පැතිර යන ආකාරය ආදිය ඊට උදාහරණ වේ.

මෙම අවස්ථා රසවත් හා සජීව ආකාරයෙන් ඉදිරිපත් කිරීම පාඨක රසාස්වාදයට ඉවහල් වී ඇත.

**කාව්‍යෝපක්‍රම භාවිතය**

ගුත්තිලයේ වර්ණනා අර්ථාලංකාරයෙන් හා ශබ්දාලංකාරයෙන් විචිත්‍රවත් කොට ඉදිරිපත් කිරීම එහි රසවත් භාවයට බෙහෙවින් උපකාරී වේ.

උචිත භාෂා ව්‍යවහාර මෙන් ම උපමා, රූපක හා උත්ප්‍රේක්ෂා ආදි අලංකාර භාවිතය මෙම පද්‍යවල නිරන්තරයෙන් දැකිය හැකි ය. එසේ ම අවස්ථෝචිත ව විවිධ විරිත් භාවිතය, එළිසමය, අනුප්‍රාසය,

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

සහ රිද්මය, උචිත පරිදි වර්ණනා සඳහා යොදා ගැනීම ආදි කරුණු පිළිබඳ ව ද අවධානය යොමු කිරීම අවශ්‍ය වේ.

ඉහත දක්වා ඇති කරුණු ඇසුරෙන් යෝග්‍ය නිදසුන් තුනක් වත් අන්තර්ගත කරමින් පිළිතුරු සපයා තිබීම ප්‍රමාණවත් වේ.

**(සමස්තයක් සේ සලකා ලකුණු ලබා දෙන්න.)**

**(ලකුණු 15 යි)**

5. "නීතියේ සමානත්වය අභියෝගයට ලක් වීම හේතුවෙන් අසීමාන්තික ලෙස පීඩාවට පත් වූ ජන කොට්ඨාසයක් බැද්දේගම නවකථාවෙන් නිරූපණය කෙරේ." නිදසුන් තුනක් වත් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 15 යි.)

බැද්දේගම නවකතාවෙන් නිරූපිත ව ඇත්තේ සොබාදහමේ අකාරුණික බවින් ද මානව ක්‍රියාකාරකම්වල දුෂ්ටභාවයෙන් ද නිරන්තරයෙන් පීඩනයට ලක් වූ ජනකොටසකගේ ජීවිතය යි. යුක්තිය අපේක්ෂා කරන බොහෝ දෙනා විශ්වාසය තබන නීතියේ සමානත්වය පවා ඔවුන් සම්බන්ධයෙන් සාධාරණයක් ඉටු කර තිබේ ද යන්න ගැටලුවකි. බැද්දේගම ජනයා එසේ නීතියේ සමානත්වය අභියෝගයට ලක්වීම හේතුවෙන් අසීමාන්තික ලෙස පීඩනයට පත් වූ ආකාරය පැහැදිලි කිරීම සඳහා යෝග්‍ය නිදසුන් කිහිපයක් පහත දැක් වේ.

- ❖ ගසක් කැපීම හෝ හේනක් කෙටීම සඳහා ආණ්ඩුවේ අවසරයක් අවශ්‍ය වූ අතර එම අවසරය ගැමියන්ට ලබා දුන්නේ ආණ්ඩුවේ නියෝජිතයා වූ ගමේ ආරච්චිගෙනි. එහි දී ඔහු තම විරුද්ධවාදීන් පීඩනයට ලක් කරමින් කටයුතු කිරීම (2 වන පරිච්ඡේදය )
- ❖ ආරච්චිගේ හා වෙදරාලගේ කුමන්ත්‍රණ අනුව හින්නිහාමිට අමානුෂික ලෙස පහරදීම හා එයින් ඇය මරණයට පත්වීම පිළිබඳ ව නීතිය ක්‍රියාත්මක නොවීම (6 වන පරිච්ඡේදය)
- ❖ ප්‍රනාන්දු,පුංචි මැණිකා සම්බන්ධයෙන් කරන යෝජනා සම්බන්ධයෙන් කරන යෝජනාවට අකමැති වීම නිසා ආරච්චි, බබුන්ට හා සිලිඳුට වගා කිරීම සඳහා හේන් බලපත්‍රයක් නොදීම. එනිසා ඔවුන්ගේ ජීවනෝපාය මාර්ගයට බාධා පැමිණීම. (7 වන පරිච්ඡේදය )
- ❖ බබුන් බොරු නඩුවකට පටලවා සිරගත කිරීම (7 වන පරිච්ඡේදය )
- ❖ සිලිඳු බබෙහාමි ආරච්චි හා ප්‍රනාන්දු මරා දැමීමට පොලඹවන්නේ ආරච්චිගේ ක්‍රියාකලාපය යි. එහි දී කෝරාල රටේ මහත්තයා ආදි නිලධාරීන් ද ගැමියන්ගේ ගැටලු කෙරෙහි අනවබෝධයෙන් කටයුතු කිරීම (7 වන පරිච්ඡේදය)
- ❖ ඉංග්‍රීසීන් ලබා දෙන බ්‍රිතාන්‍ය නඩු තීන්දු යටතේ බබුන් හා සිලිඳු වැන්නවුන් පීඩනයට පත්වීම

මේවා අතරින් යෝග්‍ය නිදසුන් තුනක් තෝරා ගෙන පිළිතුරු සපයා තිබීම අපේක්ෂිත ය.

**(සමස්තයක් සේ සලකා ලකුණු ලබා දෙන්න.)**

**(ලකුණු 15 යි.)**

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**6.** කෙටිකතාවක චරිත නිරූපණය යන්න පැහැදිලි කොට, ඒ. වී. සුරවීරගේ අකුරට යන වෙලාවේ කෙටිකතාවෙහි චරිත නිරූපණය එහි සාර්ථකත්වයට ඉවහල් වී තිබේ දැයි විමසන්න. (ලකුණු 15 යි.)

චරිත නිරූපණය යන්නෙන් අදහස් කෙරෙන්නේ චරිතවල ක්‍රියාකාරීත්වය විදහා පෑම යි. එය නවකතාවේ මෙන් ම කෙටිකතාවේ ද ප්‍රමුඛ ශිල්පීය උපක්‍රමයකි. ඇතැම් විචාරකයන් කෙටිකතාවෙන් නිරූපිත චරිත වටකුරු - පැතලි, සරල - සංකීර්ණ, කළු - සුදු ලෙස වර්ග කොට දක්වා තිබේ. කෙටිකතාවට අනන්‍ය ලක්ෂණ අනුව එහි සුවිශේෂී වන්නේ චරිතාංග නිරූපණය යි.

**අකුරට යන වෙලාවේ** කෙටිකතාවේ විශේෂත්වය වන්නේ එහි දී චරිත ගණනාවක් පාඨකයාට සම්මුඛ වීම යි. ඒ සෑම චරිතයක් ම කෙටිකතාවේ විකාශනයට අර්ථවත් මෙහෙයක් ඉටු කිරීම කැපී පෙනෙන ලක්ෂණයකි. එම චරිතවල අනන්‍ය වූ ලක්ෂණ විශ්වසනීයත්වයෙන් හා අපූර්වත්වයෙන් නිරූපණය කර තිබීම කෙටිකතාවේ සාර්ථකත්වයට ප්‍රබල සාධකයක් ව තිබේ.

මිස්ටර් හා මිසිස් කරුණාපාලගේ චරිත මගින් නාගරික මධ්‍යම පන්තියේ හරසුන් ආකල්ප හා ව්‍යාජ වටිනාකම් ද සංකීර්ණ මනෝභාව ද නිරූපණය කෙරේ. මැණිකා, වජිරා හා දුලානිගේ චරිතවලින් ළමා සිත් සතන්හි අව්‍යාජත්වය සේ ම පුංචිරාලගේ චරිතයෙන් ගැමි ජීවන යථාර්ථය හා සමාජ සාරධර්ම ද නිරූපණය කෙරේ.

උචිත නිදසුන් මගින් කෙටිකතාවේ චරිත නිරූපණය වී ඇති ආකාරය එහි සාර්ථකත්වයට ඉවහල් ව තිබේ ද යන්න විමසීම පිළිතුරෙන් අපේක්ෂා කෙරේ.

**(සමස්තයක් සේ සලකා ලකුණු ලබා දෙන්න.)**

**(ලකුණු 15 යි.)**

**7.** කොළඹ කවියේ ද්විතීය තරංගය/අවධිය නියෝජනය කළ පද්‍ය රචකයන් ස්වභාව සෞන්දර්යය විචිත්‍ර ආකාරයෙන් දුටුවන් ලෙස සැලකිය හැකි දැයි ඔබට නියමිත නිර්මාණවලට අදාළ නිදසුන් **තුනක්** වත් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 15 යි.)

කොළඹ කවියේ දෙවන අවධියට අයත් කවියන්ගේ නිර්මාණවල වස්තු විෂයයෙහි එක් කැපී පෙනෙන ප්‍රවණතාවක් වූයේ ස්වභාව සෞන්දර්යය විචිත්‍රාකාරයෙන් වර්ණනා කරන්නට දැක්වූ නැඹුරුව යි. එහි දී ඔවුන්ගේ නිර්මාණවලට බෙහෙවින් ම ආභාසයක් ලැබුණේ බටහිර සෞන්දර්යවාදී කවීන්ගේ හා රවීන්ද්‍රනාත් තාගෝර් කවියාගේ නිර්මාණවලිනි.

නිර්දිෂ්ට පද්‍ය අතරින් විමලරත්න කුමාරගම කවියාගේ **වන්නියේ හැන්දෑව,** එච්. එම් කුඩලිගමගේ **තවමත් ඔබ මගේය,** මීමන ප්‍රේමතිලකගේ **අඩසඳ** ආදි නිර්මාණ නිදසුන් කොට පිළිතුරු සපයා තිබීම අපේක්ෂිත ය.

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

❖ වන්නියේ හැන්දෑව

විමලරත්න කුමාරගම කවියා ගැමි ජීවන යථාර්ථය විනිවිද දුටු කවියකු වුවත් නිර්දිෂ්ට පද්‍ය පන්තිය මඟින් ඔහු වියළි කලාපීය ගම්මානයක සැඳෑ අසිරිය විචිත්‍ර ලෙස වර්ණනා කිරීමට උත්සුක වී ඇති ආකාරය ප්‍රකට වේ.

උදා:

"මළහිරු කිරණ සිප ගැවුණු පරිදි ලතු
රන්වන් වුණා පලුගස්වල මහලු පොතු"

"සෙවණැලි නිදා ගති ගම වට කළ බැද්දේ"

"දේදුනු පෑ දියේ තව පීරති සේරු
පෑපත් රළ වළලු ඉන්වෙයි හුවමාරු"

ආදි කාව්‍යෝචිත යෙදුම් මඟින් ඒ විචිත්‍රත්වය පිළිබිඹු කරන්නට කවියා සමත් වෙයි.

❖ තවමත් ඔබ මගේය

සොබාදහම හා ප්‍රේමය පිළිබඳ සංකල්පනාවක් ඇසුරෙන් ලියැවුණු මෙම කාව්‍ය නිර්මාණයෙන් ස්වභාව සෞන්දර්යයේ විචිත්‍රත්වය සහෘද මනසට නංවයි.

උදා :

"උස් කඳු මුදුන් ගන මීදුමක පාවුණා
අරුණාලෝකයක් ඇඳිරියට යාවුණා"

"දේදුනු වලාකුළු කඳු ගැට දකින තුරු
බොල් පිනි පොකුරු හිරිකඩ වැසි වැටෙන තුරු
මීදුම ගලන තුරු වනමල් පිපෙන තුරු
ඔබ අමතක නොවේ කළු ගඟ ගලන තුරු"

❖ අඩසඳ -

අඩසඳ ඇසුරෙන් මැවෙන සාරාගී වූත් සෞන්දර්යාත්මක වූත් කවි සංකල්පනාවක් ඇසුරෙන් කවියා සොබාදහමේ විචිත්‍රත්වය මවයි.

උදා :

රැටත් වදුලුවල තුරු කොළ විජිනි පතින්
මීකත් තොමෝ මදනල දී ඔබගෙ ගතින්
ආයෙත් ගිමන් නිවමින් ඇති හෙයිනි ඉතින්
බීමත් වන්න කුමුදක රස කිරණ විතින්

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

මේ හැර සාගර පලන්සූරියගේ **ඉගිලෙන සිහින** චන්ද්‍රරත්න මානවසිංහගේ **ළදරු හැඟුම්** හා පී. බී. අල්විස් පෙරේරාගේ **පැසුණු පැන** යන කාව්‍ය නිර්මාණ ආශ්‍රයෙන් ද ස්වභාව සෞන්දර්යයේ විචිත්‍රත්වය මවා පාන්නට කවීන් ගෙන ඇති ප්‍රයත්නය උචිත නිදසුන් ඇසුරින් දක්වා තිබීම අපේක්ෂා කෙරේ.

**(සමස්තයක් සේ සලකා ලකුණු ලබා දෙන්න.)**

**(ලකුණු 15 යි.)**

8. "තම සිතැඟි පාසෙට ගොදුරු වූ මනුෂ්‍යයෝ නොයෙක් ව්‍යසනයන්ට පත් වෙති." පෙමතො ජායතී සොකො නාට්‍යය ඇසුරෙන් මේ ප්‍රකාශයේ සත්‍යාසත්‍යතාව පරීක්ෂා කරන්න. (ලකුණු 15 යි.)

ස්වර්ණතිලකා වස්තුව මූලාශ්‍රය කර ගත් 'පෙමතො ජායතී සොකො' නාට්‍යය පැරණි කතාව මෙන් ඍජු ප්‍රකාශනයක් ලෙස නොවූවත් නාට්‍යයේ සමුදයාර්ථය ලෙස ඉදිරිපත් කෙරෙන්නේ තම සිතැඟි පාසෙට ගොදුරු වූ මනුෂ්‍යයන් අනේකවිධ විපත්තීන්ට ගොදුරු වන ආකාරය යි. මෙහි දී නාට්‍යයේ හරය ලෙස යොදා ගෙන ඇත.

**පෙමතො ජායතී සොකො**
**පෙමතො ජායතී භයං**

යන ආරම්භක ගායනය මෙන් ම උද්දාල බමුණා ප්‍රමුඛ කොට ගත් ඔහුගේ ශිෂ්‍යයන්ගේ චරිතවල ක්‍රියාකාරිත්වය හා එහි ප්‍රතිඵල ද අවධානයට ලක්විය යුතු ය. එහෙයින් ස්වර්ණතිලකා අනපේක්ෂිත විපතකට ගොදුරුවන්නේ තම සිතැඟිවල වහලකු වීම නිසා ද යන පැනය ගැන සිසුන්ගේ අවධානය යොමු වීම වටී. එයට හේතුව ඇයගේ චරිතය නිරීක්ෂණය කිරීමේ දී අපට පෙනී යන්නේ ඇය විවෘත මනසකින් හා අනාගතය පිළිබඳ ඉවකින් කටයුතු කළ බව යි.

පිළිතුරු ලිවීමේ දී ඉහත කරුණු මෙන් ම උද්දාල බමුණා, ස්වර්ණතිලකා ඇස ගැටුණු මොහොතේ සිට ඇය ලබා ගැනීමට ක්‍රියා කළ ආකාරය, විවාහයෙන් පසු සිප්හලට නොයාම, ඇයගේ මරණයෙන් කම්පාවට පත්ව දිවි නසා ගැනීම, සිසුන්ගේ පළිගැනීමේ චේතනාවේ ප්‍රතිඵලයක් ලෙස ඔවුන්ගේ අධ්‍යාපන අපේක්ෂා බිඳ වැටීම ආදි කරුණු පිළිබඳ ව අවධානය යොමු වී තිබිය යුතු ය. මෙම කරුණු අතරින් කිහිපයක් හෝ නාට්‍යයේ උචිත නිදසුන් ආශ්‍රයෙන් ඉදිරිපත් කිරීමට අපේක්ෂකයන් සමත් විය යුතු ය.

**(සමස්තයක් සේ සලකා ලකුණු ලබා දෙන්න.)**

**(ලකුණු 15 යි.)**

*****

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

AL/2021(2022)/71/S-II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව இலங்கைப் பரீட்சைத் திணைக்களம் Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Adv. Level) Examination, 2021(2022)

සිංහල II
சிங்களம் II
Sinhala II

**71 S II**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

| | | |
|---|---|---|
| අමතර කියවීම් කාලය | - | මිනිත්තු 10 යි |
| மேலதிக வாசிப்பு நேரம் | - | 10 நிமிடங்கள் |
| Additional Reading Time | - | 10 minutes |

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

විභාග අංකය : ..........................

උපදෙස්:

* I කොටසේ 1 ප්‍රශ්නය ද, II කොටසේ 2, 3 ප්‍රශ්න ද, ඇතුළු ව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
* 1 ප්‍රශ්නයේ ඇති සියලු ම අනුකොටස්වලට මෙ ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
* I කොටස, II කොටසේ පිළිතුරු පත් සමග අමුණා භාර දෙන්න.

## I කොටස

1. එක් එක් ප්‍රශ්නයට වඩාත් ම ගැළපෙන පිළිතුර තෝරා ගෙන, **එයට හිමි අංකය වරහන තුළ ලියන්න.**

1.1 'කහ' යන්නෙහි අන්තර්ගත ව්‍යඤ්ජනවල උත්පත්ති ස්ථානය වනුයේ,
(1) දන්තජ ය. (2) ඕෂ්ඨජ ය. (3) කණ්ඨජ ය. (4) මූර්ධජ ය. (5) තාලුජ ය. (.....)

1.2 නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පද පේළිය තෝරන්න.
(1) අරුණළු, අබිනික්මණ, සනීභවණය, සැණකෙළි, කාළගුණය
(2) අරුණලු, අබිනික්මන, සනීභවනය, සැණකෙළි, කාලගුණය
(3) අරුනලු, අභිනික්මණ, ගණීභවනය, සැනකෙළි, කාලගුනය
(4) අරුණලු, අබිනික්මන, සණීබවනය, සැණකෙලි, කාළගුණය
(5) අරුනළු, අබිණික්මන, ගනීභවනය, සැණකෙළි, කාලගුණය (.....)

1.3 අකාරාදි පිළිවෙළ අනුව නිවැරදි ව ලියා ඇති පද පේළිය තෝරන්න.
(1) දඹදෙණි, කුරුණෑගල, කෝට්ටේ, ගම්පොළ
(2) කෝට්ටෙ, ගම්පොළ, කුරුණෑගල, දඹදෙණි
(3) කුරුණෑගල, දඹදෙණි, කෝට්ටෙ, ගම්පොළ
(4) කෝට්ටේ, දඹදෙණි, ගම්පොළ, කුරුණෑගල
(5) කුරුණෑගල, කෝට්ටේ, ගම්පොළ, දඹදෙණි (.....)

1.4 පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) රකාරාංශය වෙනුවට රේඵය ද, රේඵය වෙනුවට රකාරාංශය ද යෙදිය හැකි ය.
(2) 'ඊ' යන්නට රකාරාංශය එකතු කළ හැකි ය.
(3) වචනයක ආරම්භයේ රකාරාංශය නො යෙදේ.
(4) රකාරාංශය හා රේඵය යෙදෙන ආකාරය සමාන ය.
(5) රකාරාංශය සිංහල භාෂාවේ ස්වාධීන අක්ෂරයකි. (.....)

1.5 එකිනෙකට අනුරූප වන සේ වචන යුගල යෙදී ඇති වරණය තෝරන්න.
(1) මාර්ගගත දේශන, ගුරු වැඩවර්ජන, මහාජන ආරක්ෂාව, සිසු සවිය
(2) වැටුප් විෂමතා, මර්දන නීති, විෂබීජ හරණ, සෞඛ්‍ය පරීක්ෂක
(3) වෛද්‍ය අධිකාරී, රෝහල් පරිශ්‍රය, මෙහෙයුම් මධ්‍යස්ථාන, වසංගත රෝග
(4) නිරෝධායන මධ්‍යස්ථාන, ජනමාධ්‍ය වාරණ, ආරක්ෂක විධිවිධාන, රෝග නිවාරණ
(5) වෛද්‍ය වෘත්තිය, මානසික ආතතිය, ගැටලු නිරාකරණය, පුවත්පත් නිවේදන (.....)

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

1.6 තත්සම පද පමණක් යෙදී ඇති වරණය කුමක් ද?

(1) ධරණී, බණ්ධන, ප්‍රතිඵල, මල්පල (2) යක්ෂ, දක්ෂ, පක්ෂ, වෘක්ෂ
(3) රංග, අඟ, සංඝ, අංග (4) ප්‍රවර, පවුර, ප්‍රබල, ප්‍රධාන
(5) කාල, තාල, කැල, මාල (.....)

1.7 තද්භව වචන පමණක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) වෙහෙර, ප්‍රහාර, වහර, කකර (2) මිත්, සිත්, ගීත, ගීත
(3) වක, පුබ, සක, මුබ (4) අරණ, වර්ණ, තොරණ, කර්ණ
(5) පමණ, බමන, පහණ, පරණ (.....)

1.8 විශේෂණ පූර්ව පද, උපමාන පූර්ව පද, සංඛ්‍යා පූර්ව පද හා විශේෂණ අපර පද යන සමාස පද අනුපිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.

(1) සුදුරෙද්ද, තිසරතන, නවමහල්, පැරකුම්රජ
(2) තිසරතන, නවමහල්, පැරකුම්රජ, සුදුරෙද්ද
(3) සුදුරෙද්ද, පැරකුම්රජ, නවමහල්, තිසරතන
(4) පැරකුම්රජ, නවමහල්, තිරසතන, සුදුරෙද්ද
(5) නවමහල්, සුදුරෙද්ද, පැරකුම්රජ, තිසරතන (.....)

1.9 කෘදන්තයක් නො වන පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) ඇඹැරූ, වැමැරූ, පැහැරූ, වැහැරූ (2) ඇල්ලූ, දැල්ලූ, හෙල්ලූ, ඉල්ලූ
(3) නැමිලි, කිහිලි, කිම්දිලි, කිවිසිලි (4) විසුමන්, පිසුමන්, නැසුමන්, දෙසුමන්
(5) මළ, වදාළ, කළ, මතුළ (.....)

1.10 පහත දැක්වෙන උද්ධෘතවල තද කළු අකුරෙන් මුද්‍රිත පද අයත් ක්‍රියා වර්ගය පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.

(අ) "**නිදන්න** පුත රන්කිරි"
(ආ) "ආයු බෝ **වේවා**"
(ඉ) "දත් **මැදලා** දමන"
(ඊ) "**අසමින්** කවි ගී සින්දු"

(1) මිශ්‍ර ක්‍රියා, ආශීර්වාද ක්‍රියා, විධි ක්‍රියා, පූර්ව ක්‍රියා
(2) ආශීර්වාද ක්‍රියා, විධි ක්‍රියා, පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා
(3) පූර්ව ක්‍රියා, විධි ක්‍රියා, ආශීර්වාද ක්‍රියා, මිශ්‍ර ක්‍රියා
(4) විධි ක්‍රියා, ආශීර්වාද ක්‍රියා, පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා
(5) විධි ක්‍රියා, ආශීර්වාද ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා (.....)

1.11 තද්ධිතයක් නො වන පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) අරවු, කැහැටු, බොකුටු, වකුටු
(2) දිරිමත්, සිරිමත්, ඉසුරුමත්, රූමත්
(3) පාපතම, මධුරතම, උත්තම, ජ්‍යෙෂ්ඨතම
(4) ගුණවන්ත, කරුණාවන්ත, බලවන්ත, ඥානවන්ත
(5) වෙරළත, ලවනත, සවනත, මුහුණත (.....)

1.12 උපසර්ගයක් යෙදී නැති පදයක් සහිත පද පේළිය තෝරන්න.

(1) නිර්ලෝභ, නිර්ධන, නිරුත්සාහක, නිරුදක
(2) දුදන, දුබල, දුසිරිත්, දුසිල්
(3) ඉමහත්, ඉපැරණි, ඉම්හිරි, ඉබොහෝ
(4) අභිමාන, අභියෝග, අභියාචන, අභිධර්ම
(5) සුනිමල්, සුපසන්, සුවහස්, සුමඟුල් (.....)

1.13 නිපාතයක් නො වන පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) විතර, පමණ, විපුල, තරම් (2) නිති, නිබඳ, නිතර, නිරතුරු
(3) තෙක්, දක්වා, තුරු, පටන් (4) එම්බා, එම්බල, බොල, කොල
(5) සඳහා, පිණිස, වස්, තකා (.....)

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

1.14 "**සෞඛ්‍ය** සේවාවේ **බුද්ධිමත්හු** කෝවිඩ් මර්දනය කිරීමෙහි ලා **නිරෝධායන** නීති ද **සංචරණ** සීමා ද පනවති." යන වාක්‍යයෙහි වචන යෙදී ඇති පිළිවෙළ අනුව **තද්කළු අකුරෙන්** ඇති පද අයත් වන්නේ කුමන ව්‍යාකරණ අංගවලට ද?

(1) උපසර්ග, තද්ධිත, සන්ධි
(2) සන්ධි, තද්ධිත, උපසර්ග
(3) තද්ධිත, සන්ධි, උපසර්ග
(4) උපසර්ග, සන්ධි, තද්ධිත
(5) සන්ධි, උපසර්ග, තද්ධිත (......)

1.15 සමාන ව්‍යාකරණ ලක්ෂණ නිරූපණය කරන ක්‍රියා රූප සහිත වරණය තෝරන්න.

(1) අල්ලන්නේ ය, සොල්ලන්නේ ය, හුල්ලන්නී ය, ඉල්ලන්නේ ය
(2) කවති, දෙවති, අල්ලති, නාවති
(3) දුවනු, බැලෙනු, නටනු, ලියනු
(4) හෙළුවෝ ය, නෙළුවෝ ය, පෙළුවේ ය, තැළුවෝ ය
(5) ඇන්නා ය, පැන්නා ය, දුන්නා ය, බැන්නා ය (......)

1.16 සමාසයක් **නො වන** පදයක් ඇතුළත් වරණය තෝරන්න.

(1) අනර්ථ, අන්ධකාර, අමනෝඥ, අදූරදර්ශී
(2) මහලුමඩම, දේවදූතයා, අලිසෙල්ලම, මුවහම
(3) රටජාතිය, ගුණාගුණ, නැන්දම්මා, බලුබළල්
(4) නිවැරදි, නිසොල්මන්, නිතරග, නිදුක්
(5) යොවුන්මදය, පෙම්ගඟුල, හදවිල, කරුවියන (......)

1.17 එක ම වර්ගයට අයත් සන්ධි පද ඇතුළත් වරණය තෝරන්න.

(1) අල්ලස්, අංකොට, අද්දැකීම්, අස්සන
(2) ඝනාන්ධකාර, අන්ධානුකරණය, ස්වර්ගෝත්පත්ති, වර්ගාක්ෂර
(3) බහූපකාර, හිතෝපදේශ, ක්‍රිස්තුත්පත්තිය, ගුරූපදේශ
(4) මංමුළා, මංපහරන්නා, ගංදිය, අංකෙළිය
(5) රුක්කත්තන, පොල්ලත්ත, සද්දවස, කොස්සැට (......)

1.18 ව්‍යාකරණානුකූල ව **නො ගැළපෙන** වරණය කුමක් ද?

(1) අපවාද, අපචාර, අපයෝජන, අපහරණ
(2) සරන, දරන, වරන, උරන
(3) මැටිපහන්, ගල්මෝල, යකඩබඩු, වේවැල්පුටු
(4) නටව, දුවව, බලව, කපව
(5) ඖදාර්ය, ඖචිත්‍ය, කෞශල්‍ය, සෞන්දර්ය (......)

1.19 ව්‍යාකරණානුකූල ව නිරවද්‍ය වාක්‍යය තෝරන්න.

(1) සත්පුරුෂයන් ලෝකය සුවපත් කරති.
(2) කොවිඩ් 19 නොහොත් කොරෝනා රෝගය ලක්ෂ ගණනකගේ ජීවිත බිලිගෙන ඇත.
(3) විශ්‍රාමික ගුරුවරයෙක් වූ නැණපාල මහතා සමාජ සේවකයෙක් ද වෙයි.
(4) ඒ වලව්වේ හාමු මහතා ධනවතෙක් ද බලවතෙක් ද ගුණවතකු ද විය.
(5) රෝග වැළැක්වීමේ කාර්යයේ දී වගකිවයුත්තෝ සෞඛ්‍ය බලධාරීහු ය. (......)

1.20 ලේඛන ව්‍යවහාරයට වඩාත් සුදුසු වාක්‍යය සහිත වරණය තෝරන්න.

(1) යන්තම් ඇති ඒ මර උගුලෙන් නං බේරුණා.
(2) තමාගේ ජීවිතයේ අනාගතය තමා ම සැලසුම් කළ යුතු ය.
(3) ඕන එකෙක් ගිය දෙන්, මගේ මොකෝ?
(4) හිමින් සීරුවේ ඇවිල්ල පිළිකන්න පැත්තෙන් ගෙට රිංගුවා.
(5) තාන්න මාන්න ලැබුණයි කියලා හිත හොඳ නැත්තං වගතුවක් වෙන්නෑ. (......)

(ලකුණු 20 යි.)

* *

Alevel ආපි උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

## අ.පො.ස. (උ.පෙළ) විභාගය/ க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2021 (2022)

II පත්‍රය

විෂය අංකය / பாட இலக்கம்: 71    විෂයය / பாடம்: සිංහල

## ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்

### I කොටස

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|
| 01. | 3 | 11. | 3 |
| 02. | 2 | 12. | 5 |
| 03. | 5 | 13. | 1 |
| 04. | 3 | 14. | 3 |
| 05. | 4 | 15. | 5 |
| 06. | 2 | 16. | 1 |
| 07. | 5 | 17. | 4 |
| 08. | 1 | 18. | 3 |
| 09. | 3 | 19. | 5 |
| 10. | 4 | 20. | 2 |

✪ විශේෂ උපදෙස්/ விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு 01 ලකුණ බැගින්/புள்ளி வீதம்

මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 1 × 20 = 20

www.alevelapi.com

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

## II කොටස

- මෙම කොටසින් **2, 3** ප්‍රශ්න ඇතුළු ව ප්‍රශ්න **සතරකට** පමණක් පිළිතුරු සපයන්න.

**2.** (අ) පහත සඳහන් පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

මෙරට කෘෂිකර්මාන්තය සමග අනිවාර්යයෙන් එකට බැඳී පැවති තවත් කර්මාන්තයක් වූයේ පශු සම්පත් පාලනය යි. අනුරාධපුර මුල් යුගයේ පටන් ම සත්ත්ව පාලනය කෙතරම් දුරට සංවිධානාත්මක ව පැවතියේ ද යන්න සෙල්ලිපිවල සඳහන් වන, ඒවා පිළිබඳ වගකියන කාර්යාංශ පිහිටුවා තිබීම සම්බන්ධ තොරතුරුවලින් අනාවරණය වේ. ඈත අතීතයේ සිට ගොවිතැන් කටයුතුවල දී විශේෂයෙන් ගවයා හා මී ගවයා අත්‍යවශ්‍ය සම්පතක් වූයෙන් හෙළදිව විසූ පැරැන්නන් මහත් ඕනෑකමින් ගව සම්පත රැක බලා ගැනීම සිදු කළ බවට සාක්ෂ්‍ය ඇත. ගවයා හා මී ගවයා ගොවිපළෙහි ප්‍රධානතම සහායකයා වූ අතර, භාණ්ඩ ප්‍රවාහනයේ දීත් තවලම් හා කරත්ත ඇදගෙන යාමේ දීත් ප්‍රධාන ප්‍රවාහකයා බවට පත් විය. පස්ගෝරස දේශීය ආහාර රටාවේ අතිශය වැදගත් අංගයක් විය. ගොවිපළට අවශ්‍ය ගොම පොහොර සැපයුණේ ද ගවයින්ගෙන් ම ය. මේ ආකාරයට ගවයා ජීවන සහකරුවකු බවට පත් වීම නිසා මිනිස්සු ස්වේච්ඡාවෙන් ම ගවයින් රැක බලා ගැනීමේ කාර්යයෙහි නිරත වූහ. අශ්ව ප්‍රජාව ද මෙරට මිනිසුන්ගේ ජන ජීවිතයට බෙහෙවින් ම අනුබල දැක්වූ සත්ත්ව කොට්ඨාසයකි. විශේෂයෙන් ම ප්‍රභූ පාන්තිකයන්ගේ ගමන්බිමන්වල දී අශ්වයාගේ දායකත්වය අනිවාර්ය විය.

අලි-ඇතුන් හා ඇද්දළ අතීතයේ මෙරට ප්‍රධාන අපනයන භාණ්ඩ බවට පත් ව තිබිණි. බරවැඩ කිරීමේ දී මෙන් ම ඉදිකිරීම්වල දී ද අලි-ඇතුන්ගේ සහාය ලබා ගැනිණි. අලි රැක බලන්නන්, ප්‍රතිකාර කළ වෛද්‍යවරුන් සහ ගජනායක නිලය දක්වා අලි-ඇතුන් සම්බන්ධ කාර්යාංශ දියුණුවට පත් ව පැවති ආකාරය මහනුවර සමයේ සමාජ සංවිධානය පිළිබඳ තොරතුරුවලින් සනාථ වේ. පැරැන්නන් පශු සම්පත් පාලනය පිළිබඳ දැක්වූ බලවත් උනන්දුව වඩාත් කැපී පෙනෙන්නේ සතුන් මැරීම තහනම් කිරීමෙන්, මස් කෑමෙන් වැළකී සිටීමෙන් පමණක් නො ව මෙවන් වැරදි කරන අයට බරපතළ දඬුවම් ද පැමිණවීමෙනි. දහ වන සියවසට අයත් වේවැල්කැටිය සෙල්ලිපියේ සඳහන් වන ආකාරයට හතර වන මිහිඳු රජතුමා විසින් ගවයන් හා එළුවන් මරන්නන්ට මරණ දඬුවම් පමුණුවනු ලැබ තිබේ. මේ අනුව නිගමනය කළ හැකි වන්නේ පැරැන්නන් ඔවුන්ගේ ආර්ථිකය ශක්තිමත් කර ගැනීම සඳහාත් වෙනත් විවිධ අවශ්‍යතා සපුරා ගැනීම සඳහාත් කිසියම් විධිමත් ක්‍රමවේදයකට අනුව පශු සම්පත් පාලනයේ නිරත ව ඇති බව ය.

(i) ඉහත ලේඛනයට අනුව පශු සම්පත් පාලනය පිළිබඳ පැරැන්නන් දැක්වූ බලවත් උනන්දුව කැපී පෙනෙන්නේ කවර කාරණාවල දී ද?

(ii) හතර වන මිහිඳු රජතුමාගේ සෙල්ලිපියේ දැක්වෙන පරිදි මරණ දඬුවම පමුණුවා ඇත්තේ කවුරුන්හට ද?

(iii) අලි-ඇතුන් සම්බන්ධයෙන් මෙරට පැවති නිලය කුමක් ද?

(iv) මෙහි දැක්වෙන පරිදි දේශීය ආහාර රටාවේ අතිශය වැදගත් අංගය වූයේ කුමක් ද?

(v) අලි-ඇතුන්ගේ සහාය ලබා ගත්තේ කවර කටයුතු සඳහා ද?

(vi) අශ්වයන්ගේ දායකත්වය අනිවාර්ය වූයේ කවර අවස්ථාවක දී ද?

(ලකුණු 02 × 6 = 12 යි.)

www.alevelapi.com

2.

(i) සතුන් මැරීම තහනම් කිරීමෙන්, මස් කෑමෙන් වැළකී සිටීමෙන්, (සතුන් මැරීම හා මස් කෑම යන) මෙවන් වැරදි කරන අයට බරපතළ දඬුවම් පැමිණවීමෙන්

**(කරුණු 02ක් ලියා ඇත්නම් ලකුණු 01 යි. කරුණු 03ක් ලියා ඇත්නම් ලකුණු 02 යි.)**

එක් කරුණකට ලකුණු නැත.

(ii) ගවයන් හා එළුවන් මරන්නන්ට **(එක් කරුණක් පමණක් ඇතොත් ලකුණු 01යි.)**

(iii) ගජනායක

(iv) පස්ගෝරස

(v) බරවැඩ කිරීමට, ඉදිකිරීම්වලට **(එක් කරුණක් පමණක් ඇතොත් ලකුණු 01යි.)**

(vi) ප්‍රභූ පාන්තිකයන්ගේ ගමන්බිමන්වලට **(ලකුණු 02 x 6 = 12 යි.)**

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

(ආ) පහත දැක්වෙන උද්ධෘතය කියවා, එහි වචන සංඛ්‍යාව **තුනෙන් එකක් පමණ වන සේ** සාරාංශ කොට ලියා, සාරාංශය අග වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

සෞඛ්‍ය අංශයේ දැනට අත්කරගෙන ඇති ප්‍රගතිය තව දුරටත් ශක්තිමත් කිරීමට මෙන් ම සෞඛ්‍ය සේවා ලබා ගැනීම සඳහා සැමට සම අවස්ථා ලබා දීම හා ප්‍රදේශීය වශයෙන් පවතින විෂමතා අඩු කිරීම කෙරෙහි යොමු වූ සෞඛ්‍ය ප්‍රතිපත්තියක් පවත්වා ගෙන යාමට රජය කැප වී සිටියි. ඒ අනුව, බෝ වන රෝග හා බෝ නො වන රෝග පැතිරීම අඩු කිරීම මඟින් ආයු අපේක්ෂාව තව දුරටත් ඉහළ නැංවීම සහ වැළැක්විය හැකි රෝග අඩු කිරීම මඟින් ජීවිතවල ගුණාත්මකභාවය ඉහළ නැංවීම සෞඛ්‍ය ප්‍රතිපත්තියේ පුළුල් අරමුණ වී ඇත. වතු, දුෂ්කර ග්‍රාමීය ප්‍රදේශ, ගැටුම්වලින් පීඩාවට පත් ප්‍රදේශ හා ව්‍යසනවලට භාජන වූ ප්‍රදේශවල සිටින අඩු ආදායම්ලාභී ජනතාවට සෞඛ්‍ය සේවා ලබා ගැනීම සඳහා වන ප්‍රවේශය වැඩි කිරීම සඳහා නම්‍යශීලී සෞඛ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය කළ යුතු ව ඇත. මේ අරමුණු ළඟා කර ගැනීම පිණිස සෞඛ්‍යය සඳහා වන ශබ්ධා ඒකක හා ප්‍රජා සහභාගිත්වය ශක්තිමත් කිරීම, සෞඛ්‍ය සේවා සැපයීම වැඩි දියුණු කිරීම, සෞඛ්‍ය භාරකාරිත්වය හා කළමනාකරණය වැඩිදියුණු කිරීම, මානව සම්පත් කළමනාකරණය වැඩිදියුණු කිරීම සහ සම්පත් බෙදා හැරීම හා උපයෝජනය සෞඛ්‍ය මූල්‍ය සම්පත් වැඩිදියුණු කිරීම යන ප්‍රධාන අංශ පහකින් සමන්විත උපාය මාර්ගික සෞඛ්‍ය සංවර්ධන සැලසුමක් සකස් කොට ඇත.

ද්විතීයික හා තෘතීයික සෞඛ්‍ය සේවා සපයන්නන් මත ඇති වන පීඩනය අඩු කිරීම සඳහා දැනට පවතින ප්‍රාථමික මට්ටමේ සෞඛ්‍ය සේවා පද්ධතිය ශක්තිමත් කිරීම අතිශයින් වැදගත් වේ. රෝගීන් ප්‍රාථමික සෞඛ්‍ය සේවා සපයන්නන්ගෙන් සේවා ලබා ගැනීමෙන් වැළකී උසස් මට්ටමේ රෝහල්වලින් හෝ පෞද්ගලික විශේෂඥ වෛද්‍යවරුන්ගෙන් හෝ සේවා ලබා ගැනීම වර්තමානයේ දක්නට ලැබෙන ප්‍රවණතාවකි.

(ලකුණු 13 යි.)

(ආ) සාරාංශය (වචන 70 - 80)

- සෞඛ්‍ය අංශයේ අත්කරගෙන ඇති ප්‍රගතිය ශක්තිමත් කිරීම, සැමට සම අවස්ථා ලබා දීම, ප්‍රදේශීය විෂමතා අඩු කිරීම කෙරේ යොමු වූ සෞඛ්‍ය ප්‍රතිපත්තියක් පවත්වා ගෙන යාමට රජය කැප වී සිටීම
- බෝ වන හා නොවන රෝග පැතිරීම අඩු කිරීමෙන් ආයු අපේක්ෂාව ඉහළ නැංවීමත්, වැළැක්විය හැකි රෝග අඩු කිරීමෙන් ජීවිතවල ගුණාත්මකභාවය ඉහළ නැංවීමත් සෞඛ්‍ය ප්‍රතිපත්තියේ පුළුල් අරමුණ ය
- මේ සඳහා අංශ පහකින් යුත් උපාය මාර්ගික සෞඛ්‍ය සංවර්ධන සැලසුමක් සකස් කොට තිබීම
- ප්‍රාථමික මට්ටමේ සෞඛ්‍ය සේවා පද්ධතිය ශක්තිමත් කොට සෞඛ්‍ය සේවයේ පීඩනය දුරු කිරීම
- රෝගීන් උසස් මට්ටමේ රෝහල්වලින් හෝ පෞද්ගලික විශේෂඥ වෛද්‍යවරුන්ගෙන් සේවාව ලබා ගැනීම වර්තමාන ප්‍රවණතාවක් වීම

**ඉහත කරුණු ඇතුළත් ව ලේඛන ව්‍යවහාරයෙන් සාරාංශය ලියා තිබිය යුතු ය. සාරාංශය එක් ඡේදයක් ලෙස දක්වා තිබිය යුතු අතර, ඡේදවලට බෙදා ඇත්නම්, සමස්තයෙන් ලකුණු දෙකක් අඩු වේ. වචන සංඛ්‍යාව 70 - 80 අතර තිබිය යුතු ය. එම ප්‍රමාණය අඩු හෝ වැඩි හෝ වේ නම් ලකුණු 02ක් අඩු වේ.**

| | | |
|---|---|---|
| සාරාංශයේ නියමිත වචන ප්‍රමාණයට | - | ලකුණු 02 යි. |
| භාෂා නිරවද්‍යතාවට | - | ලකුණු 03 යි. |
| අන්තර්ගතයට | - | ලකුණු 08 යි. |

www.alevelapi.com

3. දී ඇති මාතෘකාවලින් **එකකට** අදාළ ව වචන **300-350** අතර වන සේ විශ්ලේෂණාත්මක රචනාවක් ව්‍යාකරණානුකූල ව ලියන්න.

(i) විචාරශීලී හා සංවේදී පුද්ගලයකු බිහි කිරීමෙහි ලා සාහිත්‍ය සේවනයෙන් සැපයෙන පිටුබලය
(ii) ස්ථිරසාර කෘෂිභෝග සංවර්ධන ව්‍යාපෘති දියත් කිරීමේ දී ශ්‍රී ලංකාවට මුහුණ පෑමට සිදු වන අභියෝග
(iii) සමුද්‍රීය පරිසර සංරක්ෂණය සඳහා යොදා ගත හැකි ප්‍රායෝගික ක්‍රමෝපාය
(iv) නෛතික පියවර මෙන් ම මානව ආකල්ප සංවර්ධනය කිරීමෙන් ද සුරක්ෂිත විය යුතු ළමා අයිතිවාසිකම්
(v) බලවතුන් අතර හටගැනෙන යුද ගැටුම් හේතුවෙන් පීඩාවට පත් වන ගෝලීය ප්‍රජාව

(ලකුණු 25යි.)

වාක්‍ය රචනයට ලකුණු දීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කිරීම සුදුසු ය.

i. රචනය සඳහා තෝරා ගත් මාතෘකාව යටතේ ප්‍රමාණවත් ලෙස කරුණු ඒකරාශීකරණය
ii. එම කරුණු සංවිධානාත්මක ව ඉදිරිපත් කිරීම
iii. කරුණුවල පැහැදිලි බව
iv. නිරවද්‍ය අක්ෂර වින්‍යාසය අනුගමනය කර තිබීම
v. ව්‍යාකරණ දෝෂ රහිත වීම
vi. භාෂාව ව්‍යක්ත ලෙස හැසිර වීම
vii. සුදුසු ලෙස පද බෙදීම හා ඡේද වෙන් කිරීම
viii. කියවිය හැකි සේ අත්අකුරු පැහැදිලි වීම

- විවිධ භාෂාත්මක ප්‍රයෝග භාවිතය (මෙහි දී උපමා, රූපක, ආප්තෝපදේශ, ප්‍රස්තාව පිරුළු වැනි අංග ගැන සැලකිල්ල යොමු කරන්න. එහෙත් ඒ වෙනුවෙන් වෙන වෙන ම ලකුණු දීම අනවශ්‍ය ය. සමස්තයක් වශයෙන් රචනාවෙහි මෙකී අංග සලකා ලකුණු ප්‍රදානය කළ හැකි ය.)

**(වචන සංඛ්‍යාව 300 - 350 අතර වේ නම් ඉහළ ලකුණු ප්‍රදානය කළ හැකි ය. වචන 400ට වැඩි වේ නම් හෝ 250ට අඩු වේ නම් හෝ ලකුණු 03ක් අඩු කළ යුතු වේ.)**

(ලකුණු 25 යි)

4. (අ) පහත සඳහන් වාක්‍යවල සදොස් තැන් ඇතොත් නිදොස් කොට ලියන්න.

(i) අමාලි හෝ අමල් හෝ අමිලා හෝ ගමට යන්නේ ය.
(ii) සියලු සිවුපා සත්තු හිංසාකාරීහු නො වෙති.
(iii) ප්‍රකට දාර්ශනිකයෙක් වූ ඇරිස්ටෝටල් දක්ෂ කාව්‍ය විචාරකයෙක් ද වෙයි.
(iv) ව්‍යක්ත ලේඛකයන් විසින් ඉංග්‍රීසි කෘතීහු සිංහලට පරිවර්තනය කරනු ලැබූහ.
(v) එම්බල පුරුෂය, සතෙක් මෙන් වැඩ නො කරන්න.

i. අමාලි හෝ අමල් හෝ අමිලා හෝ ගමට යන්නී ය.
ii. නිවැරදි වාක්‍යයකි.
iii. ප්‍රකට දාර්ශනිකයකු / දාර්ශනිකයෙකු වූ ඇරිස්ටෝටල් දක්ෂ කාව්‍ය විචාරකයෙක් ද වෙයි.
iv. නිවැරදි වාක්‍යයකි.
v. එම්බල පුරුෂය, සතකු / සතෙකු මෙන් වැඩ නො කරන්න.

**(ලකුණු 01 x 5 = 05 යි)**

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

(ආ) පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවන්න.

(i) ගොවීහු මහ කන්නය සඳහා සුදුසු කෘෂි බීජ තෝරා ගනිති.

(ii) ඇමතිවරු 'කෝප්' කමිටු වාර්තාව අනුමත කරති.

(iii) විදුහල්පතිතුමා සාහිත්‍ය උත්සවයේ දී මා ඇගයුවේ ය.

(iv) විද්‍යා චක්‍රවර්තීහු බුත්සරණ රචනා කළහ.

(v) ඔවුහු එකී සම්මානය සඳහා දක්ෂ ලේඛිකාවක නම් කරති.

i. ගොවීන් / ~~(ගොවියන්)~~ විසින් මහ කන්නය සඳහා සුදුසු කෘෂි බීජ තෝරා ගැනේ / ගැනෙයි / ගනු ලබයි / ගනු ලැබෙයි.

ii. ඇමතිවරුන් විසින් 'කෝප්' කමිටු වාර්තාව අනුමත කෙරෙයි / කෙරේ / කරනු ලබයි / කරනු ලැබෙයි.

iii.. විදුහල්පතිතුමා විසින් සාහිත්‍ය උත්සවයේ දී මම ඇගයිණිමි / අගයනු ලැබීමි / අගයනු ලැබුවෙමි / අගයන ලද්දෙමි.

iv. විද්‍යා චක්‍රවර්තීන් විසින් බුත්සරණ රචනා කෙරිණි. / කැරිණි / කෙරුණේ ය / කරනු ලැබී ය / කරනු ලැබුවේ ය / කරනු ලැබිණි / කරන ලදි / කරන ලද්දේ ය.

v. ඔවුන් විසින් එකී සම්මානය සඳහා දක්ෂ ලේඛිකාවක් නම් කෙරේ / කෙරෙයි / කරනු ලබයි / කරනු ලැබෙයි. /

(ලකුණු 01 x 5 = 05 යි.)

(ඉ) නිවැරදි වාක්‍යයක් නිර්මාණය කිරීම සඳහා සුදුසු පද වරහන් තුළින් තෝරා ලියන්න.

(i) කුඩා (ව්‍යාපාරිකයන්/ව්‍යාපාරිකයෝ) සීනි තොග (සඟවති/සඟවනු ලබති.)

(ii) (ශිෂ්‍යයෝ ද අපි ද/ශිෂ්‍යයන් ද අපි ද) ඒ උත්සවයට (යති/යමු.)

(iii) ආරාධිත (අමුත්තන්/අමුත්තෝ) සභා ගර්භයට පිවිස (ඇත/ඇත්තේ ය.)

(iv) (මිනිසුන්/මිනිස්සු) වසංගතයෙන් මිය යද්දී (නායකයෝ/නායකයන්) මුනිවත රකිති.

(v) (වියතුන්/වියත්තු) මෙන් කටයුතු කරන (පුද්ගලයෝ/පුද්ගලයන්) සමාජයට ආදර්ශ දෙති.

| | | |
|---|---|---|
| i. | ව්‍යාපාරිකයෝ | - සඟවති |
| ii. | ශිෂ්‍යයෝ ද අපි ද | - යමු |
| iii. | අමුත්තන් | - ඇත. |
| iv. | මිනිසුන් | - නායකයෝ |
| v. | වියතුන් | - පුද්ගලයෝ |

(ලකුණු 01 x 5 = 05 යි.)

www.alevelapi.com

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

5. පහත දැක්වෙන වාක්‍යවල **තද කළු අකුරෙන්** මුද්‍රිත පදවල ව්‍යාකරණ අංගය දක්වා ඇත. ඒවායෙහි අනු-අංගය දක්වන්න.

(i) ත්‍යාග **ප්‍රදානෝත්සවය** බණ්ඩාරනායක අනුස්මරණ **සම්මන්ත්‍රණ ශාලාවේ** දී පැවැත්වේ.
(**ප්‍රදානෝත්සවය** - සන්ධි, **සම්මන්ත්‍රණ** - උපසර්ග, **ශාලාවේ** - විභක්ති)

(ii) මුදු සුමුදු **සුසුදු** වත මුදු ව සිපගත් **පියාණෝ** සිය පුතුට **නිමල** සිතින් සමුදුන්හ.
(**සුසුදු** - උපසර්ග, **පියාණෝ** - තද්ධිත, **නිමල** - සමාස)

(iii) සමහර **තරුණතරුණියෝ සද්දිනක්** මඟුල් **කා** විවාහ උත්සව පවත්වති.
(**තරුණතරුණියෝ** - සමාස, **සද්දිනක්** - සන්ධි, **කා** - ක්‍රියා)

(iv) **වැව්ජලය** පිස **හමන මඳසුළඟ** ජනයාගේ ගත දාහය නිවී ය.
(**වැව්ජලය** - සමාස, **හමන** - කෘදන්ත, **මඳසුළඟ** - සමාස)

(v) **අනේ! මාගේ** වස්තුවට වූ මේ විපත දෙවියෝ ම **බලත්වා!**
(**අනේ** - නිපාත, **මාගේ** - විභක්ති, **බලත්වා** - ක්‍රියා) (ලකුණු 03 × 5 =15 යි.)

| | වචනය | ව්‍යාකරණ අංගය | අනු අංගය |
|---|---|---|---|
| i | ප්‍රදානෝත්සවය | සන්ධි | ස්වරාදේශ සන්ධි/ සරදෙස් සඳ / ගුණ සන්ධි |
| | සම්මන්ත්‍රණ | උපසර්ග | අර්ථය තීව්‍ර කිරීමේ උපසර්ග / මනා යන අර්ථය ඇති උපසර්ග |
| | ශාලාවේ | විභක්ති | ආධාර විභක්ති / අදර විබත් |
| ii | සුසුදු | උපසර්ග | අර්ථෝද්දීපනය කිරීම් අර්ථය / භූෂණාර්ථය / අධික යන අර්ථය / වඩා යන අර්ථය |
| | පියාණෝ | තද්ධිත | ගෞරවාර්ථ තද්ධිත |
| | නිමල | සමාස | අව්‍යය සමාසය / අවිය සමස් |
| iii | තරුණ තරුණියෝ | සමාස | 'ද' කාරාර්ථ සමාසය / 'ද' අරුත් සමස් |
| | සද්දිනක් | සන්ධි | පර රූප සන්ධි / පර රූ සඳ |
| | කා | ක්‍රියා | පූර්ව ක්‍රියා / පෙර කිරිය |
| iv | වැව්ජලය | සමාස | විභක්ති සමාස/ විබත් සමස් / ආධාර විභක්ති සමාස/ අදර විබත් සමස් |
| | හමන | කෘදන්ත | වර්තමාන කාල කර්තෘ කාරක කෘදන්ත / වර්තමාන කෘදන්ත |
| | මඳසුළඟ | සමාස | විශේෂණ සමාසය / වෙසෙසුන් සමස් |
| v | අනේ | නිපාත | භාවාර්ථයේ නිපාත / ඛේදාර්ථයේ නිපාත |
| | මාගේ | විභක්ති | සම්බන්ධ විභක්ති / සබඳ විබත් |
| | බලත්වා | ක්‍රියා | ආශීර්වාද ක්‍රියා / ආසි කිරිය / ප්‍රාර්ථනා ක්‍රියා |

(ලකුණු (01 x 3) x 5 = 15 යි.)

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

6. (අ) පහත දැක්වෙන වාක්‍යවල හිස් තැනට වඩාත් ම ගැළපෙන පදය වරහන තුළ දී ඇති පද අතුරෙන් තෝරා ලියන්න.

(i) සමහරු ...................... රටවල සංචාරයෙහි යෙදීමට බෙහෙවින් කැමති වෙති.

(ii) වර්තමාන ...................... ප්‍රජාව ගුණධර්මයන්ගෙන් හීන යැයි ඇතැම්හු චෝදනා කරති.

(iii) ඇ සිය ...................... යුග්මය අඤ්ජනයෙන් සරසා ගත්තා ය.

(iv) "සරසවි ...................... අයිතීන් දිනා ගැනීමට පෙළ ගැසෙමු" යි කැඳවුම්කරු පැවසී ය.

(v) යම් රටක් ...................... ආධිපත්‍යයට නතු වූ විට ඒ රටෙහි ස්වාධීනත්වය වියැකී යයි.

(vi) යොවුනඟනගේ ...................... කැලුම් වැද ප්‍රියයාගේ මුව පියුම විකසිත වී ය.

(ශිෂ්‍ය, විදෙස්, නේත්‍ර, විදේශ, සිසු, නෙත්) (ලකුණු $\frac{1}{2} \times 6 = 03$ යි.)

(අ)

i. විදෙස්
ii. ශිෂ්‍ය
iii. නේත්‍ර
iv. සිසු
v. විදේශ
vi. නෙත්

(ආ) පහත සඳහන් වාක්‍යය වර්තමාන ලේඛන ව්‍යවහාරයෙන් ලියන්න.

විස්ස විජ්ජාලේ ගිය සමහර අය කියන්නෙ කතා කරන බාසාවෙන් ලියනෙක හොඳ නැහෙයි කියල. (ලකුණු $\frac{1}{2} \times 6 = 03$ යි.)

විශ්ව විද්‍යාලයට ගිය සමහර අය පවසන්නේ / කියන්නේ කතා කරන භාෂාවෙන් ලියනෙක යහපත් නො වන බව යි.

(ඉ) තද කළු අකුරෙන් මුද්‍රිත පදවල විභක්ති නම් කරන්න.

(i) **වනයෙන්** එළියට ආ මිනිසා මට **අතින්** සංඥා කළේ ය.

(ii) **ගමේ** සැඳෙන දේවල් ගුණදායක යැයි ඔහු **කඩෙන්** එළවලු නො ගෙනෙයි.

(iii) ගුණමකු **මිනිස**, නුඹ **නුඹගේ** ධනය පරලොව රැගෙන යව'යි නැණවතා කී ය.

(ලකුණු $\frac{1}{2} \times 6 = 03$ යි.)

i. වනයෙන් :- අවධි විභක්තිය / අවදි විබත
අතින් :- කරණ විභක්තිය / කරණ විබත

ii. ගමේ :- ආධාර විභක්තිය / අදර විබත
කඩෙන් :- අවධි විභක්තිය / අවදි විබත

iii. මිනිස :- ආලපන විභක්තිය / අලප් විබත
නුඹගේ :- සම්බන්ධ විභක්තිය / සබඳ විබත

(ඊ) අවශ්‍ය තැන්වල විරාම ලක්ෂණ යොදා පහත දැක්වෙන කොටස නැවත ලියන්න.

"අහෝ අපගේ රටට වූ විනාශයක්. මේ විපතින් මුළු මහත් රටවැසියා ම අනතුරක ය; අවිනිශ්චිතතාවක ය උභතෝකෝටිකයක ය මින් මිදීමට අපට මාර්ගයක් නැත්තේ ම ද අසහාය නායකයාණනි අපගේ මේ දුෂ්කරතාව දෙස බලා අපට පිහිට වන සේක්වා"

(ලකුණු $\frac{1}{2} \times 6 = 03$ යි.)

(ඊ) "අහෝ! අපගේ රටට වූ විනාශයක්. මේ විපතින් මුළු මහත් රටවැසියා ම අනතුරක ය; අවිනිශ්චිතතාවක ය; උභතෝකෝටිකයක ය. මින් මිදීමට අපට මාර්ගයක් නැත්තේ ම ද? අසහාය නායකයාණනි, අපගේ මේ දුෂ්කරතාව දෙස බලා අපට පිහිට වන සේක්වා!"

(උ) පහත දැක්වෙන ප්‍රකාශවල එක් එක් ප්‍රකෘති කථනය විකෘති කථනයට හරවා ලියන්න.

(i) "මම මේ රටින් පිටව යමි" යි කමල් කීවේ ය.

(ii) "නිලධාරීන් ආයතනයෙන් පිට වී යද්දී කම්කරුවෝ කෑගසමින් සිටියහ" යි වාර්තාකරු පැවසී ය.

(iii) "මෙතැනින් බැහැරට යන්න" යි ගුරුතුමා ශිෂ්‍යයාට දැන්වී ය. (ලකුණු $01 \times 3 = 03$ යි.)

i. තමා ඒ රටින් පිටව යන බව කමල් කීවේ ය.

ii. නිලධාරීන් ආයතනයෙන් පිට වී යද්දී කම්කරුවන් කෑගසමින් සිටි බව වාර්තාකරු පැවසී ය.

iii. එතැනින් බැහැරට යන ලෙස ගුරුතුමා ශිෂ්‍යයාට දැන්වී ය.

7. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

කෝකිලයන්ගේ **කූජනයෙන්** ද සිංහයන්ගේ ගර්ජනාවෙන් ද හස්තීන්ගේ **කුඤ්චනාදයෙන්** ද ඒ වනගැබ ඒකනින්නාද විය. හංසාංගනාවෝ නිල් ජල තලය මත ඔබිනොබ සරති. **මුවගණෝ** ළපලුපත් සිය මුවගෙහි රුවා ගනිති. ඔදවත්, තෙදවත්, බලවත් **හස්තිරාජයෙක්** වනය දෙවනත් කරමින් ඒ මේ අත දුවයි. මින් කම්පිත ව භීතියට පත් වූ කුළුමීමෝ හිස් ලූ ලූ අත දුවමින් ක්ෂණයෙන් අතුරුදන් වූහ. **ව්‍යාඝ්‍රයාගේ** සංචාරයෙන් හා රෞද්‍ර නාදයෙන් තැතිගත් මුව පොව්වෝ පසු නොබලා දිව ගොස් වන වදුලක සැඟ වුණහ. **මයුරයෝ** කේකාධ්වනි පවත්වා මනෝරම්‍ය වූ **නර්තනයකින්** වනයේ අසිරිය දෙගුණ තෙගුණ කළහ. මේ කෝලාහලයෙන් භීතියට පත් ව ඇලළී ගිය හා පොව්වෝ වහවහා ගුල් තුළට වැදුණහ.

(i) **තද කළු** අකුරින් මුද්‍රිත වචන අකාරාදි පිළිවෙළින් පෙළ ගස්වා ලියන්න.

(ii) කෝකිල, අතුරුදන්, භීතියට යන වචනවල යෙදී ඇති පිළි වෙන වෙන ම ලියන්න.

(iii) අස්ත්‍යර්ථයේ තද්ධිත පද **තුනක්** මේ ඡේදයෙන් උපුටා දක්වන්න.

(iv) හංසාංගනාවෝ, ඔබිනොබ, මුවගෙහි යන වචන විසන්ධි කරන්න.

(v) මේ ඡේදයේ ඇතුළත් යංශයක් හා කණ්ඨජ ඝෝෂ මහාප්‍රාණයක් අන්තර්ගත වචනයක් උපුටා දක්වන්න.

(ලකුණු $03 \times 5 = 15$ යි.)

i. කුඤ්චනාදයෙන්, කූජනයෙන්, නර්තනයකින්, මයූරයෝ, මුවගණෝ, ව්‍යාඝ්‍රයාගේ, හස්තිරාජයෙක්

**(මෙහි වචනයක් හෝ අඩු නම්, එක් වචනයක හෝ අකාරාදි පිළිවෙළ වැරදි නම් ලකුණු හිමි නො වේ)**

(ලකුණු 01 x 3 - 03 යි)

| | | |
|---|---|---|
| ii. කෝකිල | - | කොම්බුව, ඇළපිල්ල හා දීර්ඝත්ව ලක්ෂණය / කොම්බුව සහ හල් ඇළපිල්ල, කෙටි ඇලපිල්ල |
| ~~ඇළපිල්ල~~ | - | ~~කෙටි ඉස්පිල්ල~~ |
| අතුරුදන් | - | කෙටි පාපිල්ල / කෙටි වක් පාපිල්ල, කෙටි පාපිල්ල / කෙටි ඇද පාපිල්ල |
| භීතියට | - | දීර්ඝ ඉස්පිල්ල, කෙටි ඉස්පිල්ල |

(ලකුණු 01 x 3 - 03 යි)

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

iii. ඔදවත්, තෙදවත්, බලවත්

(ලකුණු 01 x 3 = 03 යි.)

iv. හංස + අංගනාවෝ
ඔබින් + ඔබ
මුව + අඟෙහි

(ලකුණු 01 x 3 = 03 යි.)

v. ව්‍යාසුයාගේ

(ලකුණු 03 යි.)

(සියල්ල ලකුණු 03x 5 = 15 යි.)

8. පහත සඳහන් මාතෘකාවලින් **තුනක්** තෝරා ගෙන කෙටි සටහන් ලියන්න.

(i) දන්තජාක්ෂර
(ii) වර්තමාන කාල කෘදන්ත
(iii) ස්ත්‍රීලිංග නාම පද
(iv) මිශ්‍ර ක්‍රියා පද
(v) ආගම සන්ධිය

(ලකුණු 05 × 3 =15 යි.)

www.alevelapi.com

(මෙහි හැඳින්වීමට ලකුණු 02 යි. උදාහරණවලට ලකුණු 03 යි.)

**(i) දන්තජාක්ෂර**

උඩු දත්වැටිය කරා දිව්තුඩ පැමිණ ස්පර්ශ වීමෙන් උපදින අක්ෂර දන්තජ අක්ෂර යි. එනම් දත්වලින් උපදින අක්ෂර යි,

| | | | |
|---|---|---|---|
| උදා :- | ස්වර | - | ඎ, ඏ |
| | ව්‍යඤ්ජන | - | ත, ථ, ද, ධ, න, ඳ, ල, ස |

**(ii) වර්තමාන කාල කෘදන්තඃ-**

වර්තමාන කෘදන්ත ප්‍රභේද දෙකකි.
1. වර්තමාන කාල කර්තෘ කාරක කෘදන්ත
2. වර්තමාන කාල කර්ම කාරක කෘදන්ත

**වර්තමාන කාල කර්තෘ කාරක කෘදන්ත**

වර්තමානයේ ක්‍රියාව සිදු වන බව හඟවන ප්‍රත්‍යය සහිත කෘදන්ත වර්තමාන කාල කර්තෘ කාරක කෘදන්ත වේ. 'න, නු, නා' ප්‍රත්‍යය තුන වර්තමාන කර්තෘ කාරක කෘදන්ත ප්‍රත්‍යය වේ.

| | | |
|---|---|---|
| කප + න | - | කපන |
| බල + නු | - | බලනු |
| නට + නා | - | නටනා |

ධාතු ප්‍රකෘතියකින් පර ව වර්තමාන කෘදන්ත ප්‍රත්‍යය යෙදීමෙන් වර්තමාන කෘදන්ත සාදාගත හැකි ය.

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**වර්තමාන කාල කර්ම කාරක කෘදන්ත**

මෙහි වර්තමාන කාල කර්තෘ කාරක ප්‍රත්‍යය තුන වන 'න, නු, නා' ප්‍රත්‍යය ම යෙදෙන අතර ධාතු ප්‍රකෘතිය හා ප්‍රත්‍යය අතර ' **ඒ** ' ප්‍රත්‍යය ද යෙදේ.

| | | |
|---|---|---|
| උදා :- | කප + එ + න - | කැපෙන |
| | බල + එ + නු - | බැලෙනු |
| | නට + එ + නා - | නැටෙනා |

(iii) **ස්ත්‍රී ලිංග නාම පද :-**

ස්ත්‍රීවාචී අර්ථයක් ප්‍රකාශ කරන නාම ස්ත්‍රී ලිංග නාම පද නම් වේ.

උදා :- ඇතින්න, අම්මා

- ස්ත්‍රී ලිංග ප්‍රත්‍යය යෙදීම

| | |
|---|---|
| -ඉනි - | යකිනි |
| -ඉකා - | මානවිකා |
| -ඉච්චි - | කුඹිච්චි |
| -ඉස්සි - | ගැටිස්සි |
| -ඉක්කි - | පැටික්කි ආදිය |

- ස්ත්‍රී වාචී ප්‍රකෘති යෙදීම

| | |
|---|---|
| අඟන - | දෙවඟන |
| දෙන - | කොටි දෙන |
| කිකිළි - | මොනර කිකිළි |
| සිටු - | සිටු දේවි |
| ස්වාමි - | ස්වාමිදූ |
| දෙවි - | දෙව්ලිය ආදිය |

- **ස්වර පූර්වීකරණය / අනන්‍යකරණය**

| | |
|---|---|
| සොර - | සෙර |
| බමුණු - | බැමිණි |
| කුකුළු - | කිකිළි |
| කුරුලු - | කිරිලි ආදිය |

www.alevelapi.com

(iv) **මිශ්‍ර ක්‍රියා පද :-**

- වාක්‍යයක කර්තෘගේ අවසාන ක්‍රියාවට මිශ්‍ර ව පවතින ක්‍රියා මිශ්‍ර ක්‍රියා වේ. එක් වාක්‍යයක් තුළ මිශ්‍ර ක්‍රියා පද කිහිපයක් වුව ද යෙදීමට පිළිවන.

  උදා:- නර්තන ශිල්පිනිය **නටමින්, ගයමින්** සිනා පායි.

- ධාතු ප්‍රකෘතියට අගින් පහත දැක්වෙන ප්‍රත්‍යය එක්කොට මිශ්‍ර ක්‍රියා නිර්මාණය කර ගත හැකි ය.

  **මින, මින්, මිනි, මිනි**

| | | |
|---|---|---|
| උදා:- | - මින - | බලමින, දුවමින |
| | - මින් - | නටමින්, ගයමින් |
| | - මිනි - | බලමිනි, නඟමිනි |
| | - මිනි - | සපමිනි, කරමිනි |

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

- පූර්ව ක්‍රියා රූපය ද්විත්ව කිරීමෙන් ද මිශ්‍ර ක්‍රියා පද නිර්මාණය වේ.

උදා:-
මතුර - මතුරා
වපුර - වපුරා
නට - නටා

**(v) ආගම සන්ධිය :-**

- පෙර පදයේ අග හා පසු පදයේ මුල ඇති අක්ෂර වෙනසකට ලක් නො කොට ඒ අතරට 'ය්, ව්, ර්' යන ව්‍යඤ්ජන අකුරු එකතු කිරීමෙන් සකසා ගනු ලබන සන්ධිය ආගම සන්ධිය යි.

උදා:- දෙ + ආකාර - දෙයාකාර
දෙ + උර - දෙවුර
පුන + උත් - පුනරුත්

- ස්වර අකුරු ආගම වන අවස්ථා ද ඇත

උදා:- දැන් + දු - දැනුදු
තුන් + රුවන් - තුනුරුවන්

www.alevelapi.com

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .